# 2021 ජනවාරි මස 07 වන දින පෙරවරු 9.30 ට මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මොරටුව මහා නගර සභාවේ 2021 ජනවාරි මස මාසික සභා රැස්වීමේ වාර්තාව

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසද හර්ෂණ අබේකෝන් මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.රන්දු නිරෝෂන මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී.සුසන්ත පෙරේරා මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.ගාවින් මත්තෙස් මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුනිල් නන්දසිරි මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 33. | මහා නගර සභා මනත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මැන්දිස් මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |

| | | | |
|---|---|---|---|
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 44. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 45. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 46. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 47. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

සහ

නාගරික ලේකම් (වැ.බ.) - එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත වැඩ බලන නාගරික ලේකම් එම්.කේ.ඩී.තාරක මුණසිංහ මහතා විසින් 2021.01.07 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

01. <u>වාර්තාව පිළිගැනීම හා සලකා බැලීම</u>

01(1) 2020.11.30 දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව.

<u>මහ නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි,2020.11.30 විශේෂ සභා රැස්විම් වාර්තාවේ පිටු අංක 15 පහල සිට 3 වන පේලිය ඔබතුමා 2020 කියන එක 2021 විය යුතුයි.දෙවන පේලිය අයවැය බිලියන 3 එතන 2 ක විය යුතුයි. 16 වන පිටුවේ පහල සිට 19 වන පේළිය ඉංග්‍රිසි පාඨය වැරදියට සටහන් වෙලා තියෙන්නේ. එය ඉෆ් යූ ෆේල් ටු ප්ලෑන් ටු ප්ලෑන් ටු ෆේල් 17 වන පිටුවේ අවසානයට ප්‍රකාශ කරපු දේ මෙහි සටහන් වෙන්නේ නැහැ.

<u>මහ නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2020.11.30 දින විශේෂ සභා රැස්වීම් වාර්තා සංශෝධන සහිතව පිළිගත යුතු යයි මා යෝජනා කර සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රී එෆ්.බී.නිලංක සිල්වා මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2020.11.30 දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව ඒකමතිකව සභා සම්මත විය.

01(2) 2020.12.10 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව.

<u>**මහ නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, 2020.12.30 දින පැවති මහා සභා රැස්වීමේදී තමුන්නාන්සේ මේ සභාවට දන්වා සිටියා කසුන් කියන මහත්මයගේ ඉඩමක් අපට ලැබී තියෙනවා කියලා. විශේෂයෙන්ම අපි නගර සභාවක, ප්‍රදේශයක කැලි කසල බැහැර කරනවා නම් තැනකට අපි සතුටු වෙන්න ඕන මහජන නියෝජිතයින් හැටියට. නමුත් නගරාධිපතිතුමනි අපි දැක්කා සිරස රූපවාහිනී නාලිකාවෙන් දින දෙකක් තිස්සේම ජඹුරලිය කියන ප්‍රදේශයේ වෙළකට මේ පස් ටික දානවා.වෙළකට පස් ටික දානවා නම් රාජ්‍ය ආයතනයක වාහන භාවිතා කරලා එතන ප්‍රශ්ණයක් තියෙනවා ගරු නගරාධිපතිතුමනි. අවට පිරිස් හිතනනේ රාජ්‍ය අනුග්‍රහයෙන් මේ ඉඩම ගොඩ කරනවා කියන හැගීමක් එනවා. ඒ නිසාවෙන්ම ආයතනය පැත්තෙන් මහජන නියෝජිතයින් හැටියට යම් කිසි අපකීර්තියකට ලක් වෙනවා. අපි කරන චේතනාව පවිත්‍ර චේතනාවක් වෙන්න පුලුවන් ඒක නිසා.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රිතුමා, ඔබතුමා මේ සම්බන්ධව කථා කරන්න කලින් මම මෙය ඉදිරිපත් කලානම් ඔබතුමා කථා නොකර සිටියි. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පනතින් උක්ත කරුන සම්බන්ධයෙන් ඔබගේ 2019.12.14 වන දින ලිපිය හා බැදේ. ඒ කියන්නේ කැස්බෑව නගර සභාවේ ගරු සභාපතිතුමාගේ. මෙකේ පැහැදිලිවම තියෙනවා භූමි ප්‍රමාණය අක්කර 1 යි රූඩ් 3 යි පර්චස් 27ක් ඇති කුඹුරු ඉඩම ප්‍රමාණය පහත 3 වන ජේදයේ අ,ආ,ඇ වශයෙන් සඳහන් කර ඇති කොන්දේසි වලට යටත්ව 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන සංශෝධන පණතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පණතේ 34. 1 වගන්තිය සඳහන් විධිවිධාන යටතේ ක්‍රිඩා පිටියක් ඉදිකර ගැනිම සඳහා යොදා ගැනිමට මෙයින් අනුමැතිය දෙමි. මේ අනුමැතිය දිලා තියෙන්නේ ගරු සභාපතිතුමාගේ ඉල්ලිම මත ගොවිජන සේවා දෙපාර්තමේන්තුව.

<u>**මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, නීත්‍යානුකුල පියවරක් අරගෙන තියෙනවා නම් අපි ඒකට විරුද්ධ වෙන්නේ නැහැ නගරාධිපතිතුමනි. ඒකට යටත්ව අපි මේකට එකඟතාවය පල කරනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඒ කාරණාවටම අදාලව ඔබතුමා සජිත් මන්ත්‍රිතුමා මතු කරන ප්‍රශ්ණයක් මුල් කරගෙන තමයි ඔබතුමා මෙම සභාවට මේ උත්තරය දෙන්නේ. ඔබතුමා දෙන උත්තරය තුල සහ සිරස මාධ්‍ය විසින් මතු කරන ලද කාරණාවේ කියන කාරණාත් එක්ක ඇති වෙච්ච ගැටලු ප්‍රමාණයක් තියෙනවා ඔබෙන් විමසලා නිවැරදි කර ගන්න. ගරු නගරාධිපතිතුමනි ඔබ කියනවා මේ සභා වාර්තාවේ 12 වන පිටුවේ ඔබේ පිලිතුරේ ගරු මන්ත්‍රිතුමා උත්සහායක් නොවෙයි අනිවර්යයෙන්ම මේක සිදු කරනවා අපේ කොන්ත්‍රාත් කරුවකු ලෙස ලියාපදිංචි වෙලා තිබෙන කසුන් මහත්මයට අයත් ඉඩම තෙත් බිමක් නොවන, දැම්මේ ඔය වත්තට.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රිතුමා, ඔබතුමාට පහසු කරන්න මේ කියන්නේ. ඔව් මුලින්ම අපි ඕක දානකොට දැම්මේ කසුන් මහත්මයාගේ තෙත් බිමකට නොවෙයි. ඔහුට අයිති සම්පූර්ණයෙන්ම ගොඩ කරපු නැති ඉඩමක. දාන අතරතුරේදී ඒ පලවෙනි පියවර ලෙස අපි දැම්මේ ඒ වත්තට. ඒ නිවුස් එක ඊයේ නිවැරදි කලා. මේ නිවුස් එක ඊයේ නිවැරදි කරලා තව නිවුස් එකක් ගියා ඒක බැලුවේ නැද්ද දන්නේ නැහැ. ඊට පස්සේ ගරු සභාපතිතුමා මට කිව්වා මම අනුමත කරපු ඉඩමක් තියෙනවා

කරුනාකරලා ඒ ඉඩමට දාන්නේ නැතුව මේ ඉඩමට දාන්න කියලා. ඒ වෙලාවේ තමයි සිරස මාධ්‍ය දාලා තියෙන්නේ. සිරස මාධ්‍යට මම කිව්වා ඔබතුමන්ලා පටලවාගෙන මේක නිවැරදි කරන්න කියලා.ඊයේ නිවුස් වලට නිවැරදි කරලා දැම්මා. ඔව් මම ඔය කියන එක දැම්මේ ඔය කුඹුරට. ඒ කුඹුරට අනුමැතිය තියෙනවා. කලින් එකට දැම්මම ඒකට ප්‍රශ්ණ නැහැ. ඒකට මම දැම්මා. හෙට මට ඒකටත් දාන්න පුලුවන් මේකටත් දාන්න පුලුවන්.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මන්ත්‍රිවරු ලෙස එකක් තමයි අපිට යම් අදහසක් ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න. අපි කථා කලාට පස්සේ ඔබතුමාට ලැබෙනවා ඒවා නිවැරදි කරන්න. අපිට මතුවෙලා තියෙන ප්‍රශ්ණය තමයි මෙය විමසන්න. ඒකට අතරින් අපට බාධා කරනකොට අපිට දැනගන්න බැරි වෙනවා. ඒ නිසා මගේ ප්‍රශ්ණය තියෙන්නේ ඔබ කියන කාරණාත් එක්ක.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, ඔබතුමා ඔය වාර්තාව සංශෝධනයක් ද කරන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,මේ වාර්තාව අද සම්මත වෙනවා. ඒ සම්මත වෙද්දි සම්මත වෙන්නේ අපට එකඟ වෙන්නේ බැරි කාරනා පදනම් කරගෙන.වාර්තාවට විරුද්ධව කරුනු ඉදිරිපත් කරන්නේ මෙන්න මේ පදනමින් කියලා.ඒ නිසා කරුණාකරලා අපිට මේ අවස්ථාව ලබා දෙන්න.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, වාර්තාවට විරුද්ධ වෙන්න කාටවත් බැහැ. නිවැරදි කරන්න පුලුවන් තමන් කියපු ප්‍රකාශයක් විතරයි.ඔබතුමා ඕක දන්නවානේ. ඔබතුමාට මොකක්ද මගේ ප්‍රකාශයක් නිවැරදි කරන්න තියෙන අයිතිය.

- සභා ඝෝෂා -

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මට කථා කරන්න අයිතිය දෙන්න මේ පිලිබඳව.මේ ඉඩමේ අයිතිය දෙන්නෙක් සතුව තියෙනවා. ඔබට පෞද්ගලික ඉඩමකට පස් ගිහින් දානකොට ඔබට ඔය කියන අනුමැතිය තියෙනවා නම්, මුලින්ම කරන්න ඕන මේ සභාවට එවලා අදාල නිලධාරින්ගේ නිර්දේශය සහිතව ඔබ අනුමැතියක් ගන්න.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා,ඔබතුමා මට වැඩ උගන්වන්න එනව ද? මගේ අයිතිය ගැන කථා කරන්නේ කොහොමද ඔබතුමා.

- සභා ඝෝෂා -

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්ප කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, රීති ප්‍රශ්ණයක් අහන්නේ. මුලසුන කියන්න කරුණාකරලා සභා වාර්තාව අනුමත වෙලා නැහැ වාර්තාව තවම යන්නේ. ඔබතුමා සභා වාර්තාව ඉදිරිපත් කලා.තවම අනුමත වෙලා නැහැ. සභාවෙන් පැන නගින ප්‍රශ්ණයක් නීත්‍යානුකූල නොවන අන්දමින් සේනක දමයන්ත විපක්ෂ නායක තුමාට කථා කරන්න දුන්නා කරුනක් ගැන. ඒක නීත්‍යානුකූල නැහැ.

නිශාන්ත මන්ත්‍රීතුමා කථා කරන ඒවා නීත්‍යානුකූල නැහැ. සභා වාර්තාවට ඇතුලත් වෙන්නත් බැහැ.තවම සභාව පටන් අරගෙන නැහැ. සභා වාර්තාවක් අනුමත කරන්නේ නැතුව සභාවක් ගැන කථා කරන්න බැහැ කාටවත්.මොකක්ද මේ නීතිය.නිශාන්ත මන්ත්‍රීතුමා අපට වඩා ජොෂ්ඨ මන්ත්‍රීවරයෙක්.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, සභා වාර්තාව අනුමත කරන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,සභා වාර්තාව අනුමත කරන වෙලාවේ තමයි ඒ වාර්තාවේ අඩංගුව තියෙන වැරදි නිවැරදි කර ගන්න අවස්ථාව ගන්නේ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, මම කරන ප්‍රකාශයක් සංශෝධනය කරන්න බැහැ. ඒකට ප්‍රශ්ණාවලියක් අහන්න. ඒකට යෝජනාවක් දාන්න. ඔබට බැහැ මේකේ තියෙන දේවල් කථා කරන්න. මම කථා කරපු දේවල් බැහැ.

- සභා ඝෝෂා -

<u>මහ නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2020.12.10 දින මහ සභා වාර්තාව සංශෝධන සහිතව පිළිගත යුතු යයි මා යෝජනා කර සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රී එෆ්.බී.නිලංක සිල්වා මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2020.12.10 දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

02. <u>ගරු නගරාධිපතිතුමාගේ නිවේදන -</u>

02(1) <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, 2021 වර්ෂයේ ජනවාරි මාසයේ සිට දෙසැම්බර් දක්වා කමිටු තිබෙන දින සඳහන් කරලා පත්‍රිකාව ඔබ අතට පත් කරනවා ඇති.

02(2) <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, මම මේ කථා කරන්නේ මොරටුව නගර සභාවට යම් කිසි අපකීර්තියක් එනවා නම් ඒ අපකීර්තිය වලක්වා ගැනීම ප්‍රධානියාගේ වගකීමක් සහ පාලක පක්ෂයේ වගකීමක්.ඒ නිසාම මම විශ්වාස කරනවා. රවිනාත් ජේ ගුණසේකර ගරු හිටපු නගරාධිපතිතුමා කසල අංගනයක් නැති කාලෙක නීත්‍යානුකූල ගිවිසුම් නැති කාලෙක ඒ ටී.කේ.චන්ද්‍රදාස මැතිතුමා, තොම්සන් ජේ මැන්දිස් මැතිතුමාලා එහෙම නැති වෙලාවක අතන මෙතන කුණු දානකොට ගිවිසුම් නැති වෙලාවේදිත් අපි කුණු දාන එක නවත්වන්න නොවෙයි ගියේ.

එතුමට හයියක් වෙන්න ගිහිල්ලා මේ නගරයේ කුණු නිත්‍යානුකූල ගිවිසුම් නොවන කාලෙත් අපි ගිහිල්ලා උදම් වුනා ඇරෙන්න රවිනාත් ජේ ගුණසේකර මැතිතුමාට මේ අපේ කුණු කියලා හිතන්න පාලකයෝ වෙන්න ඉන්න අය හරි එහෙම හීනයක් හරි දකින්න පුලුවන් අයට විතරයි. වෙන කාටවත් කරන්න බැහැයි කියන එක මගේ විශ්වාසයයි.හීනයකින් හරි හිතන්න ඕන තමන් පාලකයෙක් වෙනවයි කියලා. නැත්තන් එන්න හිතෙන්නේ නැහැ. ඒ නිසා මම මේ කටයුත්ත කලේ මේක අතේ තියාගෙන මිසක් නැතුව නොවෙයි. කොහෙන්වත් හෙට මගේ මොරටුවේ කොහෙන් හරි ගොඩ කරන්න ආවොත් බලයක් නැතුව අවසර පත්‍රයක් නැතුව ඒක වැලැක්විම මගේ වගකිමක් මිසක් ඒක ගේන එක්කෙනාගේ වගකීමක් නොවෙයි. ඒක මට පුලුවන්. මේ ගරු සභාපතිතුමා ඒ ප්‍රදේශයේ වගකියන පුද්ගලයා. ගත්ත දේ එතුමා මට කිව්වට පස්සේ මම තව කාගෙන්වත් අහන්න ඕන නැහැ. අපේ නිලධාරින් එහෙට යවන්න ඕන නැහැ. ගොවිජන සේවා එකේ කොන්දේසි මත ඒක දානවද නැද්ද කියන තීරණය ගන්නට ඕන එහෙ ඉන්න T O මහත්වරු මිසක් මොරටුව මහ නගර සභාවේ T O මහත්වරු නොවෙයි. මොරටුව මහ නගර සභාවේ ටී.ඕලා වැඩ කරන්නේ මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයට මිසක් පිලියන්දල කැස්බෑව නගර සභා බල ප්‍රදේශයට නොවෙයි.ඒක මම ඔබට වඩා හොඳින් දන්නවා. මම පරිපාලකයෙක් විදියට අවුරුදු 15 ක් මෙහි හිටපු නිසා මම ඒක හොඳින් දන්න නිසා මට කිසි බයකුත් නැහැ මම මෙය දාල තියෙන්නේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ඒ කටයුත්ත කරපු නිසා.හැබැයි අපි බලෙන් දානකොට මේක දාන්න තැනක් නැතුව අපේ කුණු කියලා අපි උදවු වුනේ මේ මොරටුව මහ නගර සභාවට ප්‍රශ්ණයක් වෙන නිසා මිසක් අපි ගිහිල්ලා කුහක වෙලාවක මාධ්‍ය සංදර්ශන කරන්න වැඩියෙන්ම මම හිතන්නේ සිරස ආයතනයට මම ගෞරවනීය ස්තුතිය පුද කරනවා මෙය නිවැරදි කිරිම සම්බන්ධව. එතුමන්ලා නිවැරදි කිරිම කලා. ඒ නිවැරදි කිරිම තුල මට කිවුවා අයියේ අනේ තව තියෙන පස් ටික එවන්න මගේ රත්තරන් අයියේ කියලා උදෙත් කථා කරලා මේ සියලුම දේ කියලා එව්වා මේක තමයි හිතවත්කම නොවෙයි මේකේ තියෙන්නේ අපේ ප්‍රශ්ණයකට එතුමා දිපු සාධාරණ උත්තරයක්. මෙතන කෑ ගහ ගහනව කාණු ශුද්ධ කරලා නැහැ, පස් ටික අතන තියෙනවා ඔක්කොම කෑ ගහනවා දාන්න යනකොට එතන ප්‍රශ්න. එම නිසා ගරු මන්ත්‍රිවරුනි මොරටුව මහ නගර සභාවේ ගෞරවය උදෙසාම ඒ කටයුත්ත කලේ මෙන්න මේ නීත්‍යානුකූල ලියවිල්ල නිසා. ඒක සිරස පිලිගත්තා. මෙතන ඒවා අහන්නේ නැතුව ආපු එකයි මෙතන ප්‍රශ්ණය තියෙන්නේ. හරියටම තවත් නිවැරදි වෙනවා මෙතන හිටියා නම්.

02(3) **<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිවරුනි, ගරු හිටපු නගරාධිපතිතුමා , ඒවගේම ජොෂ්ඨ මන්ත්‍රිවරුනි, සේනක දමයන්ත සිල්වා මැතිතුමනි, විශේෂයෙන්ම අපි සම්ප්‍රදායක් පස්සේ ගිහිල්ලා නීතිය කඩාගෙන කඩාගෙන ගිහිල්ලා එක තැනකට එන්න ලොකු උත්සහයක් දරනවා. ඒ උත්සහය මේ සභාවේ පත්වෙන අභිනව කමිටුවේ සාමාජිකයන්ගෙන් පත්වෙන සභාපතිවරුනුත් කමිටු සාමාජිකයින් ගෙනුත් ඒක ක්‍රියාත්මක කරන්න අපි උත්සහ දරනවා. නිශාන්ත ප්‍රදිනාන්දු ගරු මන්ත්‍රිතුමා දිගින් දිගටම ආවරණ අනුමැතිය යටතේ එහෙම නැත්නත් හදිසි අවශ්‍යතාවය මත ගන්නට තිබෙන හදිසි අයිතමයන් මුදල් වල වැඩ කටයුතු කිරිමේදි පුන පුනා කියන එක නවත්වන්න අපි මේ වෙනකොට උත්සහ දරලා සැලසුම් කරලා ඒ අනුව කටයුතු කරන්න සූදානම් වෙලා තියෙනවා. මේ 48 දෙනා අතරින් 47 දෙනයි කමිටු නියෝජනය කරන්න වෙන්නේ මුදල් කමිටුවට අනිවාර්යයෙන්ම සභාපති වෙන නිසා පලවෙනි වටේ අනිවර්්යයෙන්ම ගරු එක් මන්ත්‍රිවරයෙක් තවත් නියෝජනයක් නොකර යන්නට පුලුවන් කමක් නැහැ එක මන්ත්‍රිවරයෙකුට විතරක් පුලුවන් වෙනවා යන්නට ඒකට හේතුව වෙනවා මුදල් කමිටුව නියෝජනය කරන්නේ 9 වන

කමිටුව නිසා මම මුදල් කමිටුව අවසාන කමිටුව නිසා එක් මන්ත්‍රීවරයෙක් ඇර කිසිවෙකුටත් කමිටු දෙකක් නියෝජනය කරන්නට බැහැ මුදල් කමිටුවට පෙර කර්මාන්ත කමිටුවට වෙනකම් එක මන්ත්‍රීවරයෙකුට විතරයි කමිටු දෙකක් නියෝජනය වෙන්නේ අනිත් කාටවත් එහෙම නියෝජනය වෙන්න බැහැ. ඒක නිසාම ගරු මන්ත්‍රීවරුනි අපි මේ ගමන පොඩි සැලසුමක් කලා ඒකට හේතුව තමයි අපි කාලය නාස්ති කර ගනිමින් අපි අවශ්‍යතාවය ඉටු කර ගන්න බැරුව මාසික මහා සභා රැස්විමේදි පමණක් සභාවට එන සමහර මන්ත්‍රීවරු විශේෂයෙන්ම කාලය නාස්ති කරනවා. කාලය මරණවා. නමුත් මම හිතනවා කමිටු වලට මූලිකත්වය දිලා මින් ඉදිරියේදි කමිටු වලට පත්වෙන අයට ඡන්ද අයිතිය තිබුනත් කමිටු වලට පත්වෙන්නේ නැති සමහර දේශපාලන පක්ෂ වලට අද දිනයේදි අපි නියෝජනයක්  ගන්නවා අරගෙන කමිටුවට අදාල අදහස් දැක්විම හා කමිටුව නියෝජනය කරමින් තමන්ගේ මතය ඉදිරිපත් කරන්න දින 4 කට පෙර අපි න්‍යාය පත්‍රයක් එවනවා ඒ න්‍යාය පත්‍රය පක්ෂ මතයත් එක්ක එතනට ඇවිල්ලා තමන්ගේ විරෝධය මේකේ අඩුපාඩුව ගැන කථා කරලා කමිටු වාර්තාවක් සභාවට එනවා කමිටුව ගැන කථා කරන්න අපි ඉඩකඩ ටික දෙන්නේ නැහැ. මේක සේනක මහත්මයාටත් මේක අරුම දෙයක් නොවෙයි වසර 20 කට වැඩියේ පලාත් සභාවේ ඉදලා පාර්ලිමේන්තුවට මේක අරුම දෙයක් නොවෙයි හැබැයි පාර්ලිමේන්තු සම්ප්‍රදාය ක්‍රියාත්මක කරන පුංචි පාර්ලිමේන්තුව වන අපිට පුලුවන් කම තියෙනවා නීතියට යන්න සම්ප්‍රදාය පැත්තකට කරලා කාලය කන්නේ නැතුව. ඒ සඳහා කමිටුවකට ඕන නම් පැය 4 ක් දිලා, 8 ක් ඕන නම් 8 ක් දිලා, ස්ථාන පරික්ෂාවල් කරන්න ගිහිල්ලා කමිටුවේදි තීරණ ගන්න පුලුවන්. උදාහරණයකට ජනතා විමුක්ති පෙරමුණ ඉන්නනේ 4 දෙනයි.කමිටු 9 ක් තියෙනවා නමයටම නියෝජිකත්වය දෙනවා ඡන්ද අයිතිය නැතුව 4 කට  ඡන්ද අයිතිය දෙනවා. ඒක අතුරු ව්‍යවස්ථාවේ ඇති දෙයක් අතුරු ව්‍යවස්ථාවේ නැති දෙයක් ඇති කරලා හරි මේක නීතියට මේක යම් විදියකට කලමණාකරණයක් එක්ක යන්න පුලුවන් වැඩ සටහනක් හැදුවේ. නිශාන්ත ප්‍රදිනාන්දු ගරු මන්ත්‍රීතුමාට මම දුරකථනයෙන් කිවුවා. මම හිතනවා ඒ සඳහා තමන්ගේ නියෝජිකත්වය නැති මැක්සි ගරු මන්ත්‍රීතුමාට ඡන්ද අයිතිය හිමි වෙන්නේ එක කමිටුවකටයි නමුත් එතුමාට පුලුවන් කමිටු සියල්ලටම ඇවිල්ලා තමන්ට විරෝධය වෙන ඕනම කරුණකට විරෝධතාවය පලකරන්න පුලුවන් එතකොට ඒක මහ සභාවට යනවා  තමන්ට පුලුවන් ඕනැම මාධ්‍යකට ගිහිල්ලා අපි මේකට විරුද්ධ වුනා කියලා කියන්න. මෙතන කැහැ ගහ ගහ කිව්වට මොරටුව ජනතාව දන්නේ නැහැ.ලාංකිය ජනතාව දන්නේ නැහැ. සභා වාර්තාවට අපි ඒක ඇතුලත් කරනවා තමන්ගේ විරෝධතාවය. මේක නීතිය නීතිය අපි ක්‍රියාත්මක කරනවා. මම හිතනවා මම අවුරුදු 15 ක් තිස්සේ මාස ගණනාවක් තිස්සේ මට කර ගන්න බැරි වෙච්ච දේ මගේ ගරු ජොෂ්ට මන්ත්‍රීවරු විශේෂයෙන්ම මට දිගින් දිගටම මේ ගැන කථා කරලා මේක නිවැරදි කරන්න කියලා කියපු එකට මගේ ජොෂ්ඨ මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙනවා. නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමා ඔබතුමා පුන පුනා කථා කරන එක පිලිබදව අපි දැන් මේ අවුරුද්දේ කරන්න ඕන ව්‍යාපෘති පිලිබදව දැන් සැකසෙමින් ඉන්නවා අපි ඊලඟ කමිටුවට සියලුම මේ අවුරුද්දේ පලවෙනි මාස 4 දි කරන්න ඕන ව්‍යාපෘති අනුමත කරලා ක්‍රියාත්මක කරලා මැයි මාසේ අපි ඉවර කරනවා. මැයි මාසේ එක අපි අගෝස්තු මාසේ ඉවර කරනවා අපි සම්පූර්ණයෙන්ම යනවා සියලුම දේවල් අදාල වෙන්නාවු කමිටුව මගින් සිදුකරනවා. අද 2021 වර්ෂය අපි ආරම්භ කරනවා 2021 දි අපි ඒක කරනවා. හැම පක්ෂයකටම අපි තමන්ගේ අයිතිය තමන්ගේ මත තමන්ගේ විරුද්ධ විම කමිටුව තුල ඇරෙන්නට සභාව තුල ක්‍රියාත්මක  කරන්නට බැහැ. කමිටු වාර්තා සලකා බැලිම පමණයි මහ සභාවට පුලුවන් වෙන්නේ. මහ සභාවේදි ඡන්ද විමසීම් කරන්න වත් මහ සභාවේදි මුදල් කමිටුව ඇර අනිත් ඒවට ඡන්ද විමසීම් කරන්නවත් ඒ ගැන කථා කරන්නවත් නීතිය ඉඩකඩ නැති එක කමිටුවට දිලා කමිටුවෙන් ඒක ශක්තිමත් කරලා ඒ සඳහා අයිතිය නැති ඒ සඳහා

සහභාගිත්වය නැති සියලුම ගරු පක්ෂ වලට ඒ අයිතිය දීලා කටයුතු කිරිම සඳහා අද දිනයේදි පත්වෙන කමිටු වලට අවශ්‍යතාවය හදලා දෙනවා ගරු කණ්ඩායම් නායකවරු ඒ සඳහා පත් නොවෙන කමිටු වලට නම් කරන්න.

02(4) <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි, මහ නගර සභා මන්ත්‍රි ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය අද දින සභාවට සහභාගි නොවන බව දන්වා එවා තිබෙනවා.

**3.** <u>සභාව අමතා එවන ලද ආයාචනා,පෙත්සම්,පැමිණිලි හා සංදේශ සභාව හමුවේ තැබීම.</u>

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි,අද දිනයේදි මේක ආරම්භ කරන්න බැරි වුනත් ඊලඟ දිනයේදි කාටවත් නැගිටින්න පුලුවන් තමන්ගේ අතේ තියෙන ලිඛිත ප්‍රකාශය ලුහුඩින් ප්‍රකාශ කරලා ඉදිරිපත් කරන්න විතරයි. නැගිටලා වාචිකව ප්‍රකාශ කරන්න එකක් නැත්නම් සභා ගත කරන්නේ නැත. පුලුවන් කමක් තියෙනවා නම් කරුණාකරලා ඒ දෙන විදියට දෙන්න මොකද අපිත් හැදෙන්න ඔබත් හැදෙන්න මම විතරක් හැදෙන්න බැහැ සභාවත් හැදෙන්නේ නැතුව. මමත් හදා ගන්නම් මගේ වැරදි.ඔබත් හැදෙන්න ඒ විදියට. මොන විදියකටවත් පෙත්සම් ආයාචනා ඉදිරිපත් කරද්දි හැලි කියවන්න බැහැ තමන්ට පුලුවන් වෙයි තමන්ගේ කරුණු ඉදිරිපත් කරලා ඒ සඳහා කටයුතු කරන්න. අනිත් ඒවා ඔක්කොම සභා වාර්තා වලින් මම ඉවත් කරනවා.

**3(1)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි , පසුගිය මහ සභාවෙත් මම මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කලා ඔබතුමාට පැමිණිල්ලක්. ඉඩම පීරිස් මාවත නුග ගහ ආශ්‍රිතව තිබෙන ඉඩමේ ඒ භූමි ප්‍රමානය රක්ෂිතයක් හැටියට වෙන් කරලා තියෙනවා. නමුත් යාබද පුද්ගලයා මේ මොහොතේදි මැනුම් කටයුතු කරලා වැටක් ගහන්න සුදානම් වෙනවා මේ පිලිබඳව සොයා බලන්න.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ඉංජිනේරු තුමිය මේ සම්බන්ධව සොයා බලන්න.

**3(2)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි , කඩලාන ඩික්සන් ජේ ක්‍රිඩාංගනය ඉදිරිපිට තිබෙන ගේට්ටු දෙක නාගරික ඉංජිනේරු අංශයෙන් විටින් විට ඇවිල්ල අලුත්වැඩියා කරනවා ඒකට හේතුව තමයි නගරාධිපතිතුමනි ඒ පැත්තට යන විශාල ලී ලොරි හවස් භාගයේදි ක්‍රිඩාංගනයට තමයි දාන්නේ වෙලාව පහුනොත්. ඒ අවස්ථාවට ගේට්ටු කැඩෙනවා. යාබද නිවසට මම පෞද්ගලිකව කථා කරලා තමයි විදුලිය අරගෙන දුන්නේ. ඒක නවත්වලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**3(3)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි , ඉදිබැද්ද ශාන්ත බ්ලාසියුස් දේවස්ථාන භූමියේ පිටුපස කොටස අපි අලුතින් ඉදිකරනු ලැබුවා මණ්ඩපයක් හා යාඥා භූමියක් ඒ අවස්ථාවේදි විශාල වශයෙන් ඔබතුමා ලොකු දායකත්වයක් දේවස්තානයේ පියතුමාට ලබා දුන්නා. පියතුමා විශේෂයෙන් ඔබතුමාට ස්තුති කරන්න කියලා කිව්වා. නියෝජ්‍ය නගරාධිපති තුමා අපිට දායකත්වය ලබා දුන්නා,

ඒවගේම ක්‍රිෂාන්ත විජේරත්න මන්ත්‍රීතුමා ක්‍රියාකාරි දායකත්වයක් ලබා දුන්නා.ඒවගේම දායකත්වයක් ලබා දුන්නා. ඒ වගේම සෞඛ්‍ය අංශයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක තුමා ඇතුලු ඒ කණ්ඩායමටත්, විශේෂයෙන් දුල්සිරි මහත්මයා ඇතුලු ඒ කණ්ඩායමටත් විශේෂ ස්තූතියක් මේ මොහොතේදි පුද කර සිටිනවා.

**3(4)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂන අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි , ඔබතුමාට විශේෂ ස්තූතියක් පුද කරනවා මොරටුව ජනතාව වෙනුවෙන්. මෙපමන කාලයක් තාක්ෂණය දියුණු වෙලා තියෙද්දි මොරටුව මහ නගර සභාවේ නාගරික කොමසාරිස්තුමා, ආදායම් ගණකාධිකාරි තුමා ඇතුලු කණ්ඩායම ඔබතුමාගේ මඟපෙන්වීම යටතේ ඔන්ලයින් තාක්ෂණය යටතේ වරිපනම් ගෙවන්න පුලුවන් වෙලා තියෙනවා ඒ සම්බන්ධව සමස්ත මොරටු ජනතාව වෙනුවෙන් මගේ හදපිරි ස්තූතිය හා ප්‍රසංසාව පිරිනමනවා.

**3(5)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ජී.සුරංග එන් අපොන්සු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි , මේ සම්බන්ධයෙන් 2020.12.23 වන දින ගරු කොමසාරිස්තුමාට ලියාපදිංචි තැපැලෙන් ලිපියක් ලැබෙන්න සැලැස්සුවා. කොරෝනා නිසා ඒ ලිපිය ලැබෙන්න ප්‍රමාද වෙන්න ඇති. ගරු නගරාධිපතිතුමනි, මොරටුවේ වරිපනම් ගෙවන ජනතාවට අසාධාරණයක් වීම සම්බන්ධයෙන් මොරටු මහ නගර සභාව තුලින් සැලසුම් අනුමත කරනවා. නමුත් තවමත් සැලසුම් වලට ව්‍යාජ නගරාධිපතිවරු , ව්‍යාජ කොමසාරිස්වරු ඉන්නවා. එහෙම නම් ගරු නගරාධිපතිතුමනි මොරටුව බල ප්‍රදේශයට අයත් අපේ කලාප කීපයක් තියෙනවා. මොරටුව හංදිය සිට අඟුලාන මායිම දක්වා බටහිර කලාපය එය W වශයෙන් සනාථ වෙනවා. ඒවගේම එන් , එස් සහ ඊ වශයෙන් තවත් කලාප සනාථ වෙනවා. නමුත් කල්දමුල්ල බල ප්‍රදේශයට ඩබ්ලිව් තමයි සනාථ වෙන්නේ. නමුත් මේ ව්‍යාජ සැලසුමේ එස් වශයෙන් තමයි සඳහන් වෙන්නේ. අපට විශේෂයෙන්ම මේ ව්‍යාජ ලෙස අනුමත කරන සැලැස්මට තාම පුද්ගලයෙක් අපට සොයා ගන්න බැහැනේ. නමුත් මේ ඉඩම් අයිතිකරුට නගර සභාවේ මැදිහත් වෙලා ඔහුට පොලිසියෙන් පැමිනිල්ලක් ඉදිරිපත් කරලා නීතිමය කටයුත්ත කරන්න පුලුවන්. අපිට පුලුවන් මේ සභාවේ අගතියක් වෙන කාරණාව නිවැරදි කරන්නත් ඒවගේම වැරදි කරන පුද්ගලයාට නිසි දඬුවම් ලබා දෙන්නටත් මෙම ඉඩම් හිමියා වන්නේ වි.ජේ.දහනායක 10/40, 3 වන පටුමග කල්දමුල්ල මොරටුව මේ ඉඩම් හිමියාට කඩිනමින් නගරාධිපතිවරයා වශයෙන් හෝ කොමසාරිස් වරයා හෝ පැමිණිල්ලක් කරලා කඩිනමින් මේ ව්‍යාජ සැලසුම් වලට අනුමැතිය ලබාදෙන පුද්ගලයන්ට නීතිමය කටයුතු කරන ලෙස මේ ගරු සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් කරනවා. ගරු නගරාධිපතිතුමනි මේ මගේ සහෝදරියගේ ඉඩම් සම්බන්ධයෙන් අධිකරණයට යාමට කටයුත්තක් සිදු වෙනවා. නමුත් මගේ සහෝදරියට අසාධාරණයක් සිද්ධ වෙන්න තමයි මේ ව්‍යාජ සැලසුම අනුමත කරලා තියෙන්නේ ඒ සම්බන්ධයෙන් නීතිමය කටයුතු කඩිනමින් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

**3(6)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,මේ අයිතමය යටතේ ඉල්ලීමක් සහා කරුණු කිපයක් තියෙනවා ඉදිරිපත් කරන්න. එම්.කේ.ප්‍රැන්සිස් මහතා 61/13 සරසවි මාවත අගුලාන දුම්රිය පල පාර ලිපිනයේ එතුමා විසින් මීට මාස කීපයකට කලිනුත් ඔබතුමාට ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා 2020.07.27 වන දින. ඒ ප්‍රදේශයේ තිබෙන ප්‍රධාන කාණුව අවහිර වෙලා වල් බිහි වෙලා ජලය බැස යාම නිසියාකාරව සිදු නොවන නිසා සේවකයන් යොදා ඒ කාණුව පිරිසිදු කර දෙන්න කියලා.නමුත් මේ දක්වා ඒ කටයුතු සිදුවෙලා නැහැ කියලා තමයි කිව්වේ. ඔවුන් මේ පිලිබදව නැවතත් ප්‍රදේශ වාසින්ගේ අත්සන් සහිතව ලේඛණයක් ඉදිරිපත් කර තිබෙනවා. අපි ඉල්ලා සිටිනවා

කරුණාකරලා මේ පිලිබඳව අවධානය යොමු කරලා ඒ අයට උත්තරයක් ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

3(7) **<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, තමුන්නාන්සේගේ ප්‍රකාශය යටතේ මේ අයිතමය මීන් ඉදිරියට පුලුවන් වෙන්නේ ඒ අදාල ලිඛිත ලියවිලි පමණයි ඉදිරිපත් කරන්න.අපි එකඟයි ඒකට. එහෙමනම් ඔබතුමා කරුණාකරලා මේ න්‍යාය පත්‍රයේ දිගටම ගෙනියන්න. මුදල් කමිටුව අවසන් වූ වහාම නැගිටලා ඔතනින් යන්න එපා. මේ න්‍යාය පත්‍රයේ තියෙනවා පුද්ගලික අදහස්, වෙනත් කරුණු ඒවට ඉඩ දෙන්න. ඒවාට ඉඩ නොදී මන්ත්‍රීවරුන්ට කථා කරන්න අවස්ථාව නොදී, මේ මහ සභාව පමණයි මන්ත්‍රීවරුන්ට අදහස් දක්වන්න තියෙන්නේනේ ඒ අවස්ථාව නොදී ඉන්න එපා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මට ඒක කියන්න එපා. තාම වෙලා නැහැනේ .

3(8) **<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, පිරිස් ඉඩමේ කට්ටියකට ඉඩම් ඔප්පු ලබාදීලා තියෙනවා. අවසානයට ඉතිරි වුන පවුල් කීපයට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ඔබතුමාට ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒ නිවාස 6 – 7 ට වාර්ෂික බදු පදනම යටතේ බදු ලබාදෙන්න. අපි විශ්වාස කරනවා අපිට ඒකට එකඟ වෙන්න බැහැ. බදු ඔප්පු ඒ පවුල් 6 ට පමණක් ලබා දෙනවා නම්, සෙසු අයට ස්ථිර ඔප්පු ලබා දෙන්නත් මේකේ ඇති පදනම පිලිබඳව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් අපි හරි විමසීමක් කර ගන්න ඕන. සභාවක් ලෙස අපට එකඟ වෙන්න බැහැ. ඒ නිසා කරුණාකරලා මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

3(9) **<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපති තුමනි, තමුන්නාන්සේ මීට මාස කීපයකට කලින් සොයිසා පුර ක්‍රීඩා පිටියට පස් ටිපර් 4-5 විතර ගෙනත් ගොඩ බෑවා. අපි විමසීමක් කලාම ඔබතුමා කිව්වේ සොයිසා පුර ක්‍රිඩා පිටිය නැවත පස් දාලා නැවත ප්‍රතිසංස්කරණය කරනවා කියලා. හැබැයි දැන් මාස ගණනාවක් වෙනවා. ඔබතුමා දැන් එතනට ගිහිල්ලා බැලුවොත් ඒ පස් උඩින් තණකොළ වැවිලා ඒක උඩට කුණු දාන්න පටන් අරගෙන ඒ නිසා දිගින් දිගටම මේ කරුණු අපි කිව්වා මේවාට අදාල කරුණු සිද්ධ වෙන්නේ නැහැ.එතන දැන් ක්‍රිඩා පිටියේ කොටසක් කුණු දාන තැනක් බවට පත්වෙලා. අපි මන්ත්‍රිවරුන් ලෙස ගතකරන අවසන් අවුරුද්ද. ලබන අවුරුද්දේ මාර්තු වෙනකොට අපේ ධූර කාලය අවසන්. කරුණාකරල මේ අදාල ගැටලු වලට විසඳුම් සපයන්න කියන ඉල්ලීම කරනවා.

3(10) **<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපති තුමනි, ප්‍රථමයෙන්ම මා ස්තුතිය පුද කරන්න ඕන මොරටුව මහනගර සභාව වෙනුවෙන් ඔබතුමාත්, කොමසාරිස් තුමාත්, සෞඛ්‍ය අංශයත් ඝන අප ද්‍රව්‍ය වෙනුවෙන් යන්ත්‍ර මොරටුව නගර සභාවේ ස්ථාපනය කිරිම සම්බන්ධව. ඒවගේම මොරටුව තුල විශාල ජනගහනයක් ජීවත්වන නගරයක්. මේ කොවිඩ් වසංගතය තත්වයත් එක්ක මොරටුවේ වරිපනම් ගෙවන්න ඔබතුමාගේ නායකත්වයෙන් කොමසාරිස්තුමා, නියෝජ්‍ය කොමසාරිස් තුමා, ගණකාධිකාරිතුමා, මොරටුව ජනතාව වෙනුවෙන් On Line ක්‍රමය මගින් වරිපනම් ගෙවීම් අවස්ථාව ඇති කලා. විපක්ෂ මන්ත්‍රිවරයෙක් හැටියට පෞද්ගලික ස්තුතිය පුද කර සිටිනවා.

**3(11) <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපති තුමනි, 2021 වර්ෂයේ ව්‍යාපාර බලපත්‍ර ගන්න යනකොට ගිය අවුරුද්දේ නිවාස බදු වැඩි වෙලා තියෙනවා. මේ අවුරුද්දේ ව්‍යාපාර බදු වැඩි වෙලා තියෙනවා. එම නිසා මේ කොවිඩ් වසංගතයත් යටතේ මේ වගේ දෙයක් කරන්න යන එක ගැන අපි කණගාටුව පලකරන්න ඕන.

**3(12) <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපති තුමනි, ඒ වගේම කල්දමුල්ල සංවර්ධනය නොකරන ලද පාරවල් කිපයක් තියෙනවා ඒවා මේ වසර තුල සංවර්ධනය කර දෙන්න කියන ඉල්ලිම කරනවා.

**3(13) <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපති තුමනි, ඔබතුමා සමඟ අයවැය තුලදි සාකච්ජා කලා මහජන උපයෝගිතා හා ප්‍රජා සංවර්ධන කමිටුව නම නැවත සංශෝධනය කිරිමට ඔබතුමා ඒ අවස්ථාවේදි එකඟ වුනා මහජන උපයෝගිතාව, ප්‍රජා සංවර්ධනය හා කාන්තා පිළිබඳ ස්ථාවර කමිටුව.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි, මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුව ලෙස සංශෝධනය කරන්න කටයුතු කරනවා.

**3(14) <u>මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපොන්සු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ලිඛිත පැමිණිල්ලක් තියෙනවා රථ ගාල විවෘත නොකිරිම නිසා මොරටුවෙ ජනතාව අති විශාල දුෂ්කරතා වලට මුණ දුන්නා දෙසැම්බර් 20 සිට දිගටම.අපි ඔබතුමාට මධ්‍යම රජයෙන් හදලා දුන්න රථගාල ඔබතුමාට අඩුම තරමින් ඒක විවෘත කර ගන්න බැරි වුනා.ඔබතුමා ෆේල්. ඔබතුමා හිතාගෙන ඉන්නවා මේ රථ ගාලේ කඩ දාන්න. රථගාල හදලා දුන්නේ කඩ දාන්න නොවෙයි. ජනතාවට තියෙන අවශ්‍යතාවය සපුරා ගන්න.

-සභා ඝෝෂා-

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි, ගරු විපක්ෂ නායකතුමා නිරෝෂන් මන්ත්‍රිතුමා ඉදිරිපත් කරන්න වෙර වීරිය දරපු මේ පැමිනිල්ල පිලිබදව ඔබතුමාට මම එවන්නම් කරුනාකරලා මන්ත්‍රිවරුන් දැනුවත් කිරිම කරන්න. මෙය ඉදිරිපත් කරන්නේ කේ.එන්.ප්‍රියන්ත අංක 309, ලේඩි සොයිසා පාර, ලුනාව මොරටුව 2021.01.06 නගරාධිපතිතුමා මහ නගර සභාව මොරටුව. මෙම ලිපිය මොන විදියකින් වත් කියවන්න බැහැ මෙතුමාට. මේ පෙත්සම අද මම මේකට ගන්නෙත් නැහැ. ඉදිරිපත් කරන්න දන්නේ නැත්නම් කෙනෙක් ගෙන් අහගන්න ඕන. මම මුලින්ම යෝජනාවක් ලියන්න ඉගෙන ගත්තේ මිල්ටන් ද මැල් මන්ත්‍රිතුමාගෙන් දන්නේ නැති නිසා.මේක මට අයිති එකක්.ඔබතුමාට කියවන්නත් බැහැ.

-සභා ඝෝෂා-

**3(15) <u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මට සිදු වුන කරදරයක් සම්බන්ධව. ඒ අවස්ථාවේ මාව කිසිදු පෞද්ගලික රෝහලකට බාරගත්තේ නැහැ. ඒ නිසා අවසානයේ පිහිට පතන්න වුනේ කළුබෝවිල රජයේ රෝහල.මම දින 3 ක් රෝහල්ගත වෙලා ප්ලාස්ටික් සැත්කමක් පවා කලා. පෞද්ගලික රෝහලක කලා නම් ලක්ෂ 3 ක ට එහා යන මුදලක්. නමුත් ගරු නගරාධිපතිතුමනි මට දැනුනා අපි මන්ත්‍රිවරු විදියට සභාවේ රක්ෂාවරණයක් නොමැති වීම හේතුකොට ගෙන. ඒ වෙලාවේ මගෙන් විශාල ලේ වහණයක් සිදු වුනා. බැරි වෙලාවත් රෝහලේ භාර නොගත්තා නම් අද මට ලක්ෂයකට වඩා මුදලක් ගෙවන්න සිදු වෙනවා. මම ඉන්න තත්වය අනුව මට ඒක දරා ගන්න පුලුවන් කමක් නැහැ. මම ඉල්ලා සිටින්නේ ගරු නගරාධිපතිතුමනි මේ මහජන නියෝජිතයෝ වැඩි හරියක් ඇති හැකි විශාල විදියට තියෙන අය නොවෙයි. නමුත් මෙවැනි අභාග්‍ය සම්පන්න ඉරනම් වලට අපි කවුරුත් මුණ දෙන අවස්ථා වෙන්න පුලුවන්. ඒ නිසා මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා රක්ෂණයේදි මන්ත්‍රිවරයෙකුට සභාව වැය කරන මුදල මුදල් රෙගුලාසි හෝ වෙන යම් ප්‍රශ්ණයක් නම් අපිට දෙන දීමනාවෙන් යම්කිසි මුදලක් අඩු කරලා, මම අනිත් මන්ත්‍රිවරුන්ගෙන් ඉල්ලා සිටිනවා ඒකට එකඟ නම්. යෝජනාවක් විදියට පසුව ඉදිරිපත් කරන්නම්.අපේ දිමනාවෙන් කීයක් හෝ අඩු කරලා රු.1000.00 ක් වුනත් කමක් නැහැ. අපි කවුරුත් බලාපොරොත්තු නොවන අවස්ථාවල ඒ වගේ අසිරුතාවලට මුණ දෙන්න පුලුවන්. එම නිසා මම ඉල්ලා සිටිනවා ජීවිත රක්ෂණාවලියක් අපට ලබාදෙන්න කියලා.

**3(16) <u>මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, විශේෂ ස්තුතියක් කරන්න තියෙනවා. අඟුලාන සුමනාරාම, ලක්ෂපතිය ක්ෂේත්‍රාරාමය, කල්දමුල්ල සුධර්මාරාමාධිපති අතිපූජ්‍ය අඟුලාන ඛේමානන්ද නාහිමියන් පසුගිය මස 14 වන දින අපවත්වීම සිදුවුනා. ඒ අවස්ථාවේ සිට ඔබතුමා මැදිහත් වෙලා ආදාහන කමිටුව කැඳවලා විශාල වෙහෙසක් දරලා දායක සභාවේ අයට ඒ ඒ කටයුතු භාර දිලා විශාල කාර්ය භාරයක් ගරු නගරාධිපතිතුමා ඔබ තුමා ඉටු කලා. ඒ වගේම ඔබතුමා රු.60000/- ක මුදල් පරිත්‍යාගයක් ආදාහන කමිටුව වෙත ලබා දුන්නා. ඒවගේම ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා රු.25000/- ක පරිත්‍යාගයක් ආදාහන කමිටුව වෙත ලබා දිලා විශාල සහයෝගයක් ලබා දුන්නා.ගරු නගරාධිපතිතුමා ඇතුලු කාර්ය මණ්ඩලය දක්වපු සහයෝගය අභිනවයෙන් පත්වූ දායක සභාවේ සභාපති ලෙසත් කොට්ඨාශ භාර මන්ත්‍රිවරයා ලෙසත් ඔබතුමා, නියෝජ්‍ය නගරාධිපතිතුමා ඇතුලු සියලුම මන්ත්‍රිවරුන්ට/මන්ත්‍රිවරියන්ට මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා.

**3(17) <u>මහා නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, සොයිසාපුර සම්බන්ධව ගැටලු දෙකක් තියෙනවා. ක්‍රීඩා පිටියේ පවත්වාගෙන යන ජිම් එකට මුහුදු සුලගත් සමග එන ලුනු වලට යකඩ වලින් තනා තිබෙන නිසා නිතර ක්‍රියා විරහිතවීම් සිදු වෙනවා.ක්‍රීඩා කරන කුෂන් එක අබලන් තත්වයක පත් වෙලා තියෙනවා. ව්‍යායම් කරන උපකරණ වලින් 2-3 පමණයි භාවිතා කරන්න පුලුවන් වෙන්නේ.ඒ සම්බන්ධව සොයා බලන්න කියා ඉල්ලා සිටිනවා.

**3(18) <u>මහා නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, සොයිසා පුර ප්‍රධාන මාර්ගයේ ඉහල කොටස පිටස්තර වෙලදුන්ගේ තෝතැන්නක් බවට මේ වෙනකොට පත් වෙලා තියෙනවා. හවසට රථ වාහන විශාල ප්‍රමාණයක් නවත්වාගෙන ජනතාවට ගමන් කරන්න බැරි තත්වයක් ඇති වෙලා තියෙනවා ඉහල කොටස. පිටස්තර මතුගම,කළුතර වගේ වෙළඳුන්. ඒ පිලිබඳව සොයා බලන්න කියා ඉල්ලා සිටිනවා. පිටස්තර වෙලඳුන්ගේ ප්‍රශ්ණය විසඳනකොට තවත් ප්‍රශ්ණයක් මතුවෙලා තියෙනවා නිදැල්ලේ ගැවසෙන ගවයින් විශාල ප්‍රමාණයක් සොයිසා පුර කොට්ඨාශයට මුදා හැරලා තියෙනවා. ගවයින් රාත්‍රි කාලයේ ක්‍රිඩා පිටියේ ගත කරනවා. මුලු මාර්ගයම හරස් කරගෙන තමයි සිටින්නේ. ඒ

වගේම සවස 6.00 න් පසුව පාරේ ගමන් කරන්න බැරි තත්වය මතු වෙනවා. ඒ පිළිබඳව සැලකිලි මත් වෙන ලෙස ගරු නගරාධිපතිතුමනි ඉල්ලා සිටිනවා.

**3(19) <u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, කටුබැද්ද සිරිබර මැණිකේ පුර ස්ටැලින්ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරපු පෙත්සම ඉදිරිපත් කරනවා. ඒවගේම මම ඉල්ලීමක් කරනවා මම  ගිය සභාවේදි ඉදිරිපත් කලා කෝව්ළ පාරේ කෙලවර රනිල් කුරේ මහතාගේ පෙත්සමක් ඉදිරිපත් කලා ඒ සම්බන්ධව කඩිනමින් පියවර ගන්න කියලා නැවත වතාවක් ඉල්ලීමක් කරනවා.

**3(20) <u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මමත් මගේ කෘතවේදිත්වය පල කරන්න අවස්ථාවක් කර ගන්නවා. පහුගිය කාලය මුලුල්ලේම මන්ත්‍රිවරුන් බොහෝ දෙනෙක් විශේෂයෙන්ම පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මේ හැම දෙනාම ඉල්ලීමක් කලා අලුත් තාක්ෂණයට ගැලපෙන විදියට මොරටුව නගර සභාවත් නවිකරණය වෙන්න ඕන කියලා. එය යථාර්ථයක් බවට පත් කරන්න කටයුතු කල සියලුම දෙනාට ස්තුතිය පුද කර සිටිනවා. නාගරික කොමසාරිස්තුමා නියෝජ්‍ය කොමසාරිස්තුමා,ගණකාධිකාරි තුමා ඇතුලු සියලු දෙනාට අපි ස්තුතිවන්ත වෙනවා. ඒවගේම ඊලඟ පියවර ලෙස කොමසාරිස්තුමාගෙන් ඉල්ලීමක් කරනවා නගර සභාවේ නව්‍යකරණය ඉදිරියට ගෙනියන්න අපි මතක් කරන කාරණයක් තමයි අපේ සැලසුම් අංශයත් ඔන් ලයින් හරහා කරන්නත් ඒ වගේම ගබඩා කරණයත් කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම මම ඉල්ලීමක් කරනවා මේ නිලධාරින් 3 දෙනා ඇතුලු ඒ කටයුත්තට සහභාගි වුන සියලු දෙනාගේ පෞද්ගලික ලිපිගොනුවලට අගය කිරීමේ ලිපියක් අපට යවා ගන්න පුලුවන් නම් එය වැදගත් වෙනවා.

**3(21) <u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි,  කසල කලමනාකරනය සම්බන්ධයෙන් අපි හැමෝගෙම අදහස් මුදුන් පත් කරලා මොරටුව නගර සභාව කසල කළමනාකරනය සම්බන්ධව හොඳ තැනක ඉන්නවා වගේම අලුතින් කසල සම්පතක් විදියට මේ කසල කළමනාකරණය සම්බන්ධව හොඳ තැනක ඉන්නවා ඒකට කටයුතු කරපු මහජන සෞඛ්‍ය පරික්ෂක තුමන්ලා, ඒවගේම නිලධාරින්ට සේවක මණ්ඩලයට සියලුම දෙනාට ස්තුතිය ප්‍රකාශ කරන්න අවස්ථාවක් බවට පත් කර ගන්නවා.තව තවත් මේ කසල සම්පතක් බවට පත් කර ගන්න කසල වෙන් කරන හිතක් නිකසල රටක් කියන සංකල්පයට අනුව අපට කරන්න ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**3(22) <u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, පාර්ලිමේන්තුව හෝ වේවා පලාත් සභාව වේවා විශේෂයෙන් හැන්සාඩ් ගත කරනකොට ඒ සමස්ත කාරණය හැන්සාඩ් ගත කරනවා. අපේ කථා කෙටි කරලා දාන්න ගියොත් යම් ප්‍රශ්ණයක් වෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඒ සම්ප්‍රදායම කරලා  කෙටි කරාම අපි කථා කරන දේවල් සමහර වෙලාවට වෙනස් වෙනවා. ඒ නිසා මම ඉල්ලා සිටිනවා හැන්සාඩ් එක සියලුම කාරනා ඇතුලත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**3(23) <u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඉදිරිපිට තිබෙන පුරන්අප්පු චතුරශ්‍රයත්, කටුබැද්ද මාකට් එකෙත් තිබෙන ඒ පස් තමයි ඒ ස්ථානයට යැව්වේ.පහුගිය කාලේ මේක හදනකොට මිනිස්සු කිප දෙනෙක් ඇවිල්ලා ඇහුවා පස් ගෙනියන්න අපේ අත්තිවාරම පුරවා ගන්න විදියක් නැහැ. ගෙයි දිය සීරාව තියෙනවා. ඒක ආරම්භ කරපු මිනිස්සු විදියට අපි කිව්වා ව්‍යාපෘතිය ආරම්භ කරාට අපිට අයිතියක් නැහැ. ඒ නිසා ඉල්ලා සිටිනවා කටුබැද්ද තියෙන ඉඩම් ගොඩ කරනවා වගේම

මේ පැත්තේ ඉන්නවා අත්තිවාරම් පුරවා ගන්න බැරි මිනිස්සු ගොඩක්. ඒ නිසා මොරටුවේ මිනිස්සුන්ටත් ඒ අවස්ථාව ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**3(24)** **<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, කටුබැද්දේ මං තීරුව නගර සභාවට පවරා ගැනිමක් කලා එහි කටයුතුත් හොඳට වෙනවා. එහි සේවය කරනවා චමින්ද ජයලාල් ඔබතුමාලගේ පාක්ශිකයෙක්. 2015.02.17 වෙනිදා ඔහු ඉඩම් හා ගොඩ කිරිමේ සංස්ථාවට අනුයුක්ත වුනා ඔහු හොඳින් වැඩ කරගෙන යනකොට මට ඉල්ලීමක් කලා මෙතනට එන්න අවස්ථාව ලබා දෙන්න කියලා. ඒ පදනම මත ඔහුට මේ වෙනකොට ඊටීඑෆ්, ඊපීඑෆ් අනුයුක්ත කලා. මේ වෙනකොට ඒ ව්‍යාපෘතියෙන් රු.40000/- ක මුදලක් ලැබුනා.ඔබතුමාට ස්තුති වෙනවා නැවත වතාවක් ඒ ව්‍යාපෘතිය පවරා ගත්තට පස්සේ අපේ ව්‍යාපෘති වලට අනුයුක්ත කරලා තියෙනවා. ස්ථිර කිරිමක් එනකොට ගරු නගරාධිපතිතුමනි ඔහුට ප්‍රමුඛතාවය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම 40000/- ක් පඩි ගත්ත අය දැනට 28000/- ක් තමයි ගන්නේ. ඒ පිළිබඳව සලකලා ඉඩම් ගොඩ කිරිමේ සංස්ථාවට කියලා ඒ වැටුප් තලයට සමාන කරන්න යම් අතිරේක දිමනාවක් හරි ලබා ගන්න ඉල්ලිම කරනවා. ඒවගේම ගරු නගරාධිපතිතුමනි ආරක්ෂක සේවයේ යොදවලා සිටින  සේවකයන්වත් ස්ථිර කරන්න කියන ඉල්ලිමත් කරනවා.

**3(25)** **<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ කොරෝනත් සමග මොරටුවෙත් සිටිනවා,මැදපෙරදිග රටවල රැකියාවල යෙදී සිටින ජනතාව ඔවුන් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ලංකාවට එවනවා. අද ඔවුන් අසරණ වෙලා සිටිනවා ලංකාවට එනකොට කොරෝනාව ගරානාවක් කර ගත්ත පිරිසක් සිටිනවා. ඒ නිසා මොරටුවේ පිරිසත් මේකෙන් අසරණ වෙලා. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා ඒ පිරිස සහන මිලකට ලංකාවට ඇවිල්ලා ලූනාව නිරෝධායන මධ්‍යස්ථානයක් පිහිටුවලා ඒ අයට සහනයක් ලබා දෙන්න කියලා ඉල්ලිම කරනවා.

**3(26)** **<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, නගර සභාවට අයත් ඒ සම්පත ලබා දෙන්න අවස්ථාව ලැබුනා මහ නගර අමාත්‍යාංශයෙන් අපිට ලැබුනා. මේක අපට ආයෝජන විදියට ගේන්න පුලුවන් වුනා. ඒක අපිට සම්පතක්.ඒ වගේම ඒ සම්බන්ධ වුනු සියලුම දෙනාට ස්තුතිවන්ත වෙනවා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව.එය ජනතා අයිතියට ඉක්මනින් පත් කරන්න අවශ්‍යයි. ඔබතුමාගේ සිහිනයක් වුන ඒ ශ්‍රවනාගාරය වැඩ සටහනින් ඔබතුමා පාස් . ශ්‍රවණාගාරය සකස් කරද්දි ඒ ගස් වලට හානියක් නොවන අන්දමින් ඒ සිහිනයක් ඔබතුමාට යථාර්තයක් කර ගනිමින්,  විශේෂයෙන් මම දැක්කා අපේ තරුණයෙක් අපේ තිබුන බෝධින් වහන්සේ නමක් ගලවා ගෙන අලුත් තාක්ෂණයට අනුව අරගෙන ගිහිල්ලා තව තැනක හිටවනවා. ඒවගේම මෙහි තිබුන බුලු ගහ අපේ ගොඩනැගිලිවලට අපහසුතා පැමිනෙන්න පුලුවන් නමුත් ඉදිරියේදි ගස් වලට හානි නොවන ආකාරයෙන් සිදු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**3(27)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, තාපසාරාම පාර, මොරටුමුල්ල කොට්ඨාශය මොරටුව ගම්වාසින් විසින් ඉදිරිපත් කරපු පෙත්සමක් තියෙනවා. පාර දෙපස කාණු පද්ධතිය ගැඹුරු කරලා සකස් කර දෙන්න කියලා ඉල්ලිමක් කරලා තියෙනවා. ව්‍යාපාරික ස්ථාන වලට ජලය ගලා ගෙන එන බව තමයි කියා තිබෙන්නේ.

**3(28)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, න්‍යාය පත්‍රය සම්බන්ධව මහනගර සභා පනතේ 277 වන වගන්තියේ ඇ යටතේ ඔබතුමා දන්නවා න්‍යාය පත්‍රය අවසානය දක්වා අරගෙන යා යුතුයි කියලා. පසුගිය සතියේ පුද්ගලික ස්වභාවයේ කරුනු ඉදිරිපත් කරන්න බැරිවුනා එම නිසා ඔබතුමාට ගෞරවයෙන් කියනවා එම අවස්ථාව ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒවගේම පසුගිය අයවැයේදි අපට තමන්ගේ ප්‍රකාශයන් කරන්න කාලය ලැබුනේ නැහැ කියන තැන මම ඉන්නවා. අවුරුද්දකට එක වරක් ලැබෙන අයවැය මන්ත්‍රීවරුන්ට තම අදහස් ප්‍රකාශ කරන්න කාලය ලබන අයවැයේදි වත් අපට කථා කරන්න කාලය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒවගේම වසර 3 ක් තිස්සේ අරගලයක් කරලා තමයි කාන්තා මන්ත්‍රිවරියන් වෙනුවෙන් කාන්තා කමිටුවක් ස්ථාපිත කර ගැනිමට. මම ලංකාව වටේම ගිහිල්ලා ප්‍රකාශ කලා ඔබතුමාට ගෞරවයක් වශයෙන් මම කියන්නේ ගරු නගරාධිපතිතුමනි යම් හොඳක් සිදු වුනොත් අපි අනිවාර්යයෙන්ම අගය කරනවා. මනුෂ්‍යයෝ විදියට අපි හැමදාම ඉන්න ආපු පිරිසක් නොවෙයි. අපි දන්නවා ඔබතුමාගේ සමහර තැන් වල අඩුපාඩු තියෙනවා අපි ඒවා පෙන්නා දෙනවා. නමුත් අද කාන්තා කමිටුව යම්කිසි කමිටුවක් ඇතුලට දා ගන්න හරි අපිට අවස්ථාවක් ලැබුනා ඒකට බොහෝම ස්තුතියි.සංවර්ධනයෙදි ඔබතුමා අසාධාරණ කම් නොකර මොරටුව මහ නගර සභාවේ ඔබතුමා 3 වන වතාවටත් නගරාධිපතිවරයා ලෙස පත් වෙලා සිටින නිසා සාධාරණව කටයුතු කරන්න. මොරටුමුල්ල බෝධිරුක්ඛාරාම සංවර්ධන ව්‍යාපෘතියකදි පාරේ ජනතාවට ඔබතුමාගෙන් යම් අකාරුණික කමක් සිදුවුනා ඒ වගේ දේවල් නැවත කරන්න එපා කියා ඉල්ලා සිටිනවා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රිවරුනි, නිශ්චිත වශයෙන් නම් නොකලත් අනිකුත් දේශපාලන පක්ෂ වලට විශේෂයෙන්ම මැක්සි මන්ත්‍රිතුමයි නිශාන්ත මන්ත්‍රිතුමයි, කණ්ඩායම් නායකයා විදියට නිශ්චිතව නම් නොකලත් අනිත් සියලුම කණ්ඩායම් වලට ඕනෑම වෙලාවක ඒ නියෝජනයත් පක්ෂය වෙනුවෙන් ලබා දිමට ඉඩ කඩ තියෙනවා. නම් ලබා දිමේදි අපහසුවට පත් වෙන නිසා නම් අවශ්‍ය වෙන්නේ නැහැ. පක්ෂ නියෝජනය කිරිම සඳහා ඕනෑම වෙලාවක ඇවිල්ලා තමන්ගේ ප්‍රතිවිරෝධය හා අදහස් දැක්විම සඳහා නම් වලට වඩා පක්ෂ නියෝජනය සඳහා ඒ කමිටු 4 ඔබතුමාලට විවිර වෙනවා.

**3(29)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මොරටුව නගරයටම බලපාන විදියට මම පැමිණිල්ලක් ඉදිරිපත් කරනවා. මොරටුව නගරයේම පන්සල් 47 ක් , පල්ලි 23 ක් , කෝවිල් 3 ක්, සහ මුල්ලිම් පල්ලි 2 ක් ආගමික ස්ථාන නගරයේ 75 ක් තියෙනවා. නගරාධිපතිතුමනි මම විශේෂයෙන්ම කියන්න කැමතියි පොදු ප්‍රශ්ණයක් එගොල්ලන්ගේ උත්සව අවස්ථා තියෙනවා , ඒවගේම මංගල්‍යන් මේ හැම අවස්ථාවකම ඒ අය ලිපි ඉදිරිපත් කරලා තමයි ඒ අවශ්‍යතා ඉටු කර ගන්න උත්සහ කරන්නේ. නගර සභාවෙන් කෙරෙන්නාවූ පොදු කාර්යයන් සඳහා විශේෂ ඉල්ලිමක් කල යුතුයි. මේ ක්‍රමය අපට ඉතාමත්ම උචිත වෙන්නේ නැහැ. සදාචාරාත්මකව අපි බැලුවොත් ආගමික ස්ථාන අපි දකින්නේ සමාජයේ ඉහල තලයක තිබුනු ස්ථාන හැටියට.අපි ඒ කාලවකවානු සඳහන් කරගෙන ඒ අයට පීඩනයක් ඇති නොවන ආකාරයෙන් සිදු කලයුතුයි කියන ඉල්ලිම කරනවා.

**3(30)** **<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, අපි දකිනවා මැතිවරණ කාලයේදි දේශපාලන රඟපෑම් තුල මම මෙහෙම දකිනවා බණ්ඩාරනායක මැතිතුමාගේ කාලේ අපි දැක්කා දේශපාලන කතන්දරයක් තුල සිංහල මව් භාෂාව ඉස්සරහට ගෙනාවා , ඉංග්‍රිසි භාෂාව තල්ලු කලා. නමුත් අපි ඒකේ පල භුක්ති විදිනවා දැන් අපි දකිනවා ඉංග්‍රිසි භාෂාව විතරක් නොවෙයි දෙමල භාෂාව පවා පලවෙනි පංතියේ සිට උගන්වන්න නියමිතයි. ඒවගේම අපි දකිනවා සමාජය තුල සංස්කෘතික වටිනාකම් තියෙන

ස්ථාන හා ස්වභාවික විපත් හඳුන්වන්න ඒ අදාල දේවල් විශය නිර්දේශය තුලට ගෙනවිත් තියෙනවා. මේ තුලින් අපි පාඩමක් ඉගෙන ගන්න ඕන. මොකද දේශපාලනය කියන්නේ අපි දකිනවා දේශපාලන ඉහළ තලවල ඉන්න අය මුලු සමාජයම පාලනය කරනවා. ඒ අයගේ මත අනුව යම් කිසි පනත් ගේනවා. ඒ පනත් තුල රටේ අනාගතය තීරණය වෙනවා. මොරටුව පුරෝගාමීත්වයේ නගරය තුලින් හඬක් නගන්න ඕන මේ දරුවෝ ජන්දය දාන්නේ, ඉගෙන ගත් අය කියලා , ගොවියෝ කියලා ජන්දය දාන්නෙත් නැහැ. හැමෝගෙම කතිරයට එක සමාන වටිනාකමක් තියෙන්නේ. ඒක නිසා අපි හඬක් නගන්න ඕන පාසැල් අධ්‍යාපනයේ 1 වසරේ සිට දේශපාලනයේ පැතිකඩ හඳුන්වන්න අලුත් විශය ධාරාවක්, පරිසර විෂය හා සමාජ අධ්‍යනය විෂයට ඇතුල් කරලා අපේ මේ අන්ධ, මෝඩ, අනුන්ගේ වචන වලට රැවටෙන මානසිකත්වයෙන් මුදවලා ඉතා යහපත් අනාගතයක්, යහපත් රටක්, සමෘද්ධිමත් අනාගතයක් ගොඩනගා ගන්න උදවු වන පිනිස නායකයන් බිහිකරන පිණිස හොඳ මානසිකත්වයක ගොඩ නගන්න පාසැල් අධ්‍යාපනය තුලින් ඉටු කරන්න කියලා ඔබතුමා ප්‍රමුඛ මොරටු නගර සභාවෙන් සියලුම මන්ත්‍රිවරුන්ගෙන් මේ හඩ නගන ලෙස ඉල්ලා සිටිනවා.

**04.** <u>**ප්‍රශ්ණ**</u> - නැත

**05.** <u>**යෝජනා -**</u>

**05(1)** මහ නගර සභා මන්ත්‍රී ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදි.

“ ලක්ෂපතිය බිෂොප් ටෙරස් පාරේ වරිපනම් අංක 11 සමන්ත ද සිල්වා මහතාගේ නිවස අසලින් ආරම්භ වන අංක 15/2 එච්.එස්.ෆොන්සේකා මහතාගේ නිවස අසලින් අවසන් වන අතුරු මාර්ගය පළවන පටුමග නමින් නම් කරන ලෙස මෙම සභාවට යෝජනා කර සිටින්නීය.”

එම යෝජනාව මහ නගර සභා මන්ත්‍රී කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා විසින් ස්ථිර කරන ලදි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි,අංක 5(1) යෝජනාව කර්මාන්ත හා ඉදිකිරිම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(02)** නගරාධිපති, ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා විසින් කල් දි ඇති යෝජනාව, සභාවට ඉදිරිපත් කරන ලදි.

‘‘මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ මාර්ගගත සජීවී දර්ශන සහිතව පවත්වාගෙන යනු ලබන මහා පරිමාණ රේස් ඔට්ටු ඇල්ලීමේ ව්‍යාපාර (රේස් බයි රේස්) නතර කිරිමටත්, එම ව්‍යාපාරික ආයතන වලින් 2021 වර්ෂයේ සිට ව්‍යාපාර බදු අය නොකිරිමටත් කටයුතු කළ යුතු යැයි යෝජනා කරන්නීය.’’

අංක 05(02) යෝජනාව ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා විසින් ස්ථිර කරන ලදි.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාවට මම විරුද්ධ නැහැ. පැහැදිලිවම සුදුව නවත්වන්න ඕන කියන තැන මම එකහෙලාම ඉන්න පුද්ගලයෙක්. මගේ ජිවිත කාලය තුල ඇතුලට ගිහිල්ලා එලියට ඇවිල්ලා තියෙන්නේ අවස්ථා 2 යි. ඒ සුදුවට නොවෙයි කෙනෙක් හමුවෙන්න.ඊට අමතරව විදේශ රටවල යනකොට නැව් වල කැසිනෝ වලට යන්නෙත් නැහැ.

ඒ සම්බන්ධව අවබෝධයක් මට නැහැ. ඒක ප්‍රතික්ෂේප කරන පුද්ගලයෙක්.ඔබතුමා මේ ගේන යෝජනාව අපිට ක්‍රියාත්මක කරන්න පුලුවන් යෝජනාවක් ද කියන එක බලන්න ඕන. මොකද හේතුව මධ්‍යම රජයේ පනතකින් පාස් වෙලා එන ඔට්ටු ඇල්ලීමක් නිසා. එකෙදි විශාල මුදලක් කැසිනෝ තුලින් මධ්‍යම රජය අයකර ගන්නා අවස්ථාවක් වෙනවා. අපිට නවත්වන්න පුලුවන් මේ ව්‍යාපාර බදු විතරක් වෙන්න පුලුවන්. ඉතුරු ඒවා ඔක්කොම පාලනය වෙන්නේ මධ්‍යම රජයෙන්. ඒ නිසා මේ ක්‍රමය හොඳයි හැබැයි මේ ක්‍රමය ක්‍රියාත්මක වෙනවා නම් මුලු ලංකාවටම මේ නීතිය ගේන්න වෙයි. අන්න එතනට පුලුවක් කමක් තියෙනවා නම් යොමු කරන්න අපි අත් දෙකම උස්සලා තමුන්නාන්සේට ඒ සහයෝගය ලබා දෙනවා. පොඩි පැහැදිලි කිරීමක් කරන්න පුලුවන් නම් මේ ක්‍රමය අපි කරන්නේ කොහොමද කියලා දැනගන්න කැමතියි. මේ යෝජනාවට එකඟයි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි විශේෂයෙන්ම මම හිතනවා, සේනක දමයන්ත විපක්ෂ නායක තුමා කියපු කාරණය පිලිබඳව අපි අවධානය යොමු කරගෙනම තමයි මේ යෝජනාව ඉදිරිපත් කලේ. විශේෂයෙන්ම අපි දන්නවා මහරගම කියන ආසනය තුල එක වයින් ස්ටෝර්ස් එකක් වත් නැහැ.එහෙම වයින් ස්ටෝර්ස් නැති ආසන තියෙනවා. රේස් බයි රේස් නැති ආසන තියෙනවා.ඒ ජනතාවගේ ප්‍රතිවිරෝධය ඒ ආයතන තුල තියෙන විරෝධතාවය පූජනීය ස්ථාන වල තියෙන විරෝධතාවය මත රජයේ කුමන ප්‍රතිපත්ති වලට ගියත් පුලුවන් කම තියෙනවා ඒවා නතර කිරීම සඳහා. විශේෂයෙන්ම මම දන්නවා මේ සඳහා බදු ව්‍යාපාරික කටයුතු සඳහා අය නොකිරීම සඳහා අපි ගන්නා ලද තීරණය මත ඒ ව්‍යාපාරය පවත්වාගෙන නොයෑම සඳහා අධිකරණ ක්‍රියාවලියකට යාමට අපිට අවස්ථාව තියෙනවා පලාත් පාලන ආයතනයක් විදියට. ව්‍යාපාර ගැනීම බදු නොගැන්වීම සඳහා ඔහුට තියෙන අයිතියට වඩා අයිතියක් තියෙනවා මහජනතාවගේ එදිනෙදා ජීවිත වල පවුල් ඒකක වල ඇති වෙන්නාවූ තත්වය මේ තුල අපේ යෝජනාව නිසා ඇති වෙන්නාවූ නිසා යම් කිසි ස්ථාවර භාවයකට පත් වෙන්නට බොහෝ සේ ඉඩකඩ තියෙන නිසා මම හිතනවා අපේ යෝජනාව යහපත් කාලීන කරන්නට පුලුවන්. මෙන්න මේ කාරනාව හේතුකර ගෙන මම මේ යෝජනාවට විශේෂයෙන්ම බදු අය කිරීම නතර කරන්නම කියලා දැම්මේ අපිට කෙනෙකුට නීතියට ගේන්නට තියෙන එකම ඉඩකඩක් තමයි බදු අය කිරීම. එහෙම නැත්නම් බදු අය නොකිරීම කියන කාරණය මුල් කරගෙන තමයි අපිට ඒ කාරණයට යන්න පුලුවන් වෙන්නේ. මම පොඩි උදාහරණයක් කියන්නම් නම කිව්වට කිසිසේත්ම මාත් එක්ක උරණ නොවන කෙනෙක් නිසා කියන්නම ඕන. අපි කවුරුත් දන්නවා ගස් කපන නන්දන කියන්නේ ලංකාවේම ගහක් ඉරක් ඇදලා හරියටම ඒ ඉරට කපලා හරි ප්‍රසිද්ධියක් තියෙන බව මුලු ලංකාව දන්න කෙනෙක්. සාමාන්‍යයෙන් මම හිතනවා එක සැරයක් අපි රාවතාවත්ත පොදු සුසුන භූමියේ තියෙන කොට්ටම්බා ගහ යටින් පිච්චි තියෙන අවස්ථාවක අපිට බය හිතුනා ගහ කොහේට වැටෙයිද කියලා. කපාගෙන ඉවත් කරගෙන යන්න හැබැයි අපි මුදල් දෙන්නේ නැහැ ඉවත් කරගෙන යන්න විතරයි දෙන්නේ කියලා. අපි හිතන තරම් දෙයක් ගහට වෙලා තියෙන්නේ නැතුව රු.80000/- කට ගහ විකුණලා තිබුනා. එදාම රාත්‍රී මම මරණ ගෙදරකට ගිහිල්ලා එනකොට රේස් බයි රේස් එකකට ගිහිල්ලා සත පහක් වත් අතේ නැතුව පයින් එනකොට මම ගෙදරට ගිහිල්ලා දැම්මා. ඔහුට උදවුවක් කරන්න ගිහිල්ලා මම මගේ කාර්යාලයේ දෙන්නෙක් ඔහු වෙනුවෙන් ඇපකරයකට අත්සන් කලා ත්‍රිරෝද රථයක් ගැනීම සඳහා අන්තිමට අපේ කාර්යාලයේ සේවකයෝ දෙන්නාට වුනේ ආපදා ණය අරගෙන ත්‍රිරෝද රථයේ ඇපකරය ගෙවන්න. ඒ තරම්ම ආර්ථිකය අතින් මිනිසුන්ව කඩාගෙන වැටෙන තමන් දිනනවා කියා හිතලා පෙනි පෙනිම තමන් ඔට්ටු අල්ලලා ගෙදර එනවා බස් එකේ එන්න සල්ලි නැතුව පයින් එන අවස්ථා අපි දැකලා තියෙනවා. මේ නිසා මම හිතනවා මේ යෝජනාව අපිට ක්‍රියාත්මක කරන්නට මොරටුව තුල තවත් ආසන ඕන තරම් තියෙනවා රේස් බයි රේස් නැති. මොරටුව තුලත් ක්‍රියාත්මක කර ගැනීම සඳහා ගරු ඔබතුමන්ලා සියලු දෙනාගේ සහයෝගය එකඟතාවය මේ සඳහා ලැබෙයි කියන බලාපොරොත්තුව තබා ගනිමින් යෝජනාවේ මූලික විදියට කරුණු දැක්වීම කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්ප කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මුලින්ම මේ යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ඔබතුමාට පුනාානුමෝදනා කරනවා. මම හිතන විදියට මේ යෝජනාවට සියලු දෙනාම එකඟතාවය පල කරනවා. මොකද හේතුව මේ යෝජනාව අපි දැක්කට වචන හරඹයක් විතරයි කියලා ඇතුලත් කාරණාව අපි දැක්කට මේ වචන ටිකක් විතරක් නොවෙයි ගරු නගරාධිපතිතුමනි. මේක ඉපදිල සිටින දරුවාගේ සිට මියැදෙන්න ඔන්න මෙන්න හිටින වැඩිහිටියා දක්වා බලපාන ප්‍රශ්ණයක්. අනාගතයේ මේ රටේ උප්පත්තිය ලබන්න සිටින දරුවට බලපාන ප්‍රශ්ණයක්. රේස් බයි කියන එක සම්බන්ධයෙන් අද ආණ්ඩුවට සමහර වෙලාවට බදු ලැබෙන්නට පුලුවන් මත් පැන් සහ සිගරැට් වලින් අත්වෙන ප්‍රතිවිපාකයම තමයි ඊට වඩා වැඩි ප්‍රතිවිපාකයක් මේ සූදුව නිසා අත්වෙනවා. අපි ගත්තොත් එහෙම මත්පැන් බෝතලයක් එයින් බොන්න පුලුවන් යම්කිසි ප්‍රමාණයක් විතරයි. ඒ ප්‍රමාණය බිව්වට පස්සේ වෙරි වෙනවා. වෙරි වුනාට පස්සේ නවත්වනවා. වෙරි හිඳුනට පස්සේ තමයි නැවත පටන් ගන්නේ. සිගරැට් එක බොන්න පුලුවන් ප්‍රමාණයක් තියෙනවා. හැබැයි ගරු නගරාධිපතිතුමනි ඔබතුමා කිව්වා වගේ වයස් බේදයක් නැහැ. ගැණු පිරිමි බේදයක් නැහැ, සමාජ තත්වය බේදයක් නැහැ. මේ සූදුවට ඇබ්බැහි වෙන පුද්ගලයා තමන්ගේ තියෙන මුලු සේසතම සූදුව සඳහා වියදම් කරනවා. ඇතිවීමක් නැහැ. ඊලඟ තත්පරයේ ජයග්‍රහනය කරයි කරයි කියලා බලාපොරොත්තුව තුල තමන්ගේ තියෙන සියලු වත්කම් ටික පමණක් නොවෙයි දරුවගේ කණ කර වත්කම් ටික උගස් තියලා සූදු කෙලින තත්වයට පත් වෙලා තියෙනවා.විශේෂයෙන්ම මේ බුකි සම්බන්ධයෙන් කියන්නට ඕන. අපට සමහරක් වෙලාවට මේ බුකි සම්බන්ධයෙන් කථා කරන කොට සමහර සූදු වලට සමහර පුද්ගලයේ ඇබ්බැහි වෙන්නේ නැහැ. හැබැයි මේක ටිකක් වැදගත් සූදුවක් කියලා හිතනවා. රේස් බයි කියන එකවැදගත් සූදුවක්.හේතුව රේස් බයි අයිති මිනිස්සු ඉන්නවා වැදගත් විදියට. සමාජයේ වැදගත් පැලැන්තියට අයිති මිනිස්සු. ඒගොල්ලන්ව දැක්කම හිතනව මිනිස්සු මේ රේස් බයි එක වැදගත්.රේස් තුන්ඩුවක් දාන එක වැදගත්.බුරු ගහන එක අවැදගත් මේක වැදගත් කියලා. ගරු නගරාධිපතිතුමනි මේ සූදුවෙන් හරිහම්බ කර ගත්තු මිනිස්සු අද මේ රටේ විවිධ තනතුරු වල වැජඹෙනවා. හැබැයි ඒ වැජඹෙන්නේ අහිංසක මිනිසුන්ගේ ඊරි මාංස උරාගෙන බිලා. ඒක තමයි ඇත්ත කතාව.ඒ නිසා තමයි ගරු නගරාධිපතිතුමනි මේ යෝජනාව ඉතාමත්ම කාලෝචිත යෝජනාවක්. සමහර වෙලාවට මේ යෝජනාව දෙස බලනකොට සමහර වෙලාවට අපි දන්නවා ඔබතුමා කිව්වා වගේ අපි පෞද්ගලිකව දන්න පවුල් තියෙනවා. ඒ පවුල්වල සමහර තාත්තලා,අම්මලා,සීයලා, ආච්චිලා තමන්ට කාගෙන් හෝ ලැබෙන සොච්චම රේස් බුකියට ගිහිල්ලා බාර දෙනවා. කවුද ජයග්‍රහනය කරලා තියෙන්නේ. ඒ නිසා අපි පැහැදිලිව කියනවා මේ රජයට පලවෙනි වෙඩි මුරය මොරටුවෙන් පත්තුකර ගන්න ලැබුන එක අපේ ජයග්‍රහණයක් කියලා අපි දකිනවා. මේ සා විශාල විනාශයක් වෙන එක පුද්ගලයෙක්ව දෙන්නෙක්ව මහා ධන කුවේරයෝ බවට පත් කරන්නට මුලු මහත් සමාජයක්ම විනාශ වන ක්‍රියාවක් තමයි මේ රේස් බයි කියලා කියන්නේ. සමහර වෙලාවට ඒ පුද්ගලයන්ට දේශපාලනමය ශක්තිය ගන්න මේ සා විශාල මුදලක් හම්බකරලා ඒක වියදම් කරලා ගන්නේ දේශපාලන ශක්තිය. ඒක වියදම් කරලා රටේ විවිධ වැදගත් රටේ මර්මස්ථාන වලට ඒ මිනිස්සු යන්නේ. හැබැයි ඒ වැදගත් මරමස්ථාන වලට ගිහිල්ලා ඒ මර්මස්ථාන වලටත් ඒ සූදුව ගෙනියනවා. සමහර වෙලාවට ක්‍රිඩාවටත් මේ සූදුව ගෙනියනවා. ඒ නිසා ක්‍රිඩාව විනාශ වෙනවා.ඒ නිසා සමස්ත සකලවිධ ප්‍රජාවම විනාශ වෙන ක්‍රියාවක් තමයි මේ සූදුව කියලා කියන්නේ. මේ ඉදිරිපත් කරපු යෝජනාව මම හිතන්නේ ඔබතුමාගේ කාල සීමාව තුල ඔබතුමා ඉදිරිපත් කරපු හොඳම යෝජනාව විදියට මම දකින්නේ. පැහැදිලිවම ජනතාවට යහපතක් කරන්න පුලුවන් යෝජනාවක් විදියටයි මම දකින්නේ. මම ඉල්ලීමක් කරනවා මොරටු පුරවරයෙන් මේ රේස් බයි ටික අයින් කරන්න පුලුවන් නම් අපිට අපේ ජයග්‍රහනය ඒක තමයි. මොරටුවේ ඔබතුමා පත්වුනු අලුතම කාටවත් බැහැ කියපු දෙයක් කලා. හරක් මරණ එක නැවැත්තුවා මොරටුවේ.හරක් මරණ එක නවත්වනවා තියා මරණ මනුෂාාව දිහා බලන්නත් බයයි නගර සභා දේශපාලඥයෝ. මන්න අරගෙන නගර සභාව ඉදිරියට ඇවිල්ලා කිව්වා කපනවා ඔක්කොම කියලා. එහෙම කාල වකවානුවක් පහු කරලා හරක් ගේ ජීවිතය මොරටුව තුල විනාශ වෙන එක නැවැත්තුවා ඔබතුමා

ඒ සා විශාල ශක්තියක් ඔබතුමාට තිබුනා.අපි සාධනීය ලක්ෂන සාධනීය ලෙස දකින්නට ඕන. අපිත් අත උස්සලා කර ගත්ත ලොකුම පුන්‍ය කර්මයක් තමයි නගර සභා මන්ත්‍රී වරු හැටියට. ඒ වගේම පුන්‍යකර්මයක් තමයි මේක. ඒ වැනසුනේ තිරිසන් සත්තු. මේ යෝජනාව ගේන්නේ ඔබතුමා මනුසත්තු ආරක්ෂා කර ගන්න පවුල් පිටින්, අනාගත පරම්පරාව. අපේ අහිංසක දරුවන්ව ආරක්ෂා කර ගන්න.දරුවෝ කී දෙනෙක් බඩගින්නේ ඉන්නවද මේ නිසා. අපේ අම්මලා කී දෙනෙක් කඳුළු හලනවද මේ නිසා. කාන්තා හිංසනය ගැන කථා කරනවා අපි. කාන්තා නම් ඉල්ලනවා කමිටු වලට. ඒවා නොවෙයි කෙරෙන්න ඕන මෙන්න මේවා. කාන්තාවන් ලොකුම අපහසුතාවයට පත් වෙන්නේ මේ සුදුව නිසා.තමන්ගේ ස්වාමිපුරුෂයා සුදු ගහනවා නම්, බීලා එනවා නම් ඒ කාන්තාව තරම් දුක් විදින කාන්තාවක් නැහැ නගරාධිපතිතුමනි. ඒ නිසා ඔබතුමා මේ කලේ ලොකු පිංකමක්. ඔබතුමාට සතුටු වෙන්න පුලුවන් මේ යෝජනාව ඉදිරිපත් කිරිම සම්බන්ධයෙන් . ඒ පිංකමට දායක වෙන්න අත ගහන්න ලැබිම අපිටත් බොහොම සතුටුයි. මේ යෝජනාව ඉදිරිපත් කරලා නවතින්නේ නැතුව මොරටුවේ ප්‍රධාන පුරවැසියා හැටියට ඔබතුමා පෙරමුණ ගන්න මේ රේස් බයි ටික මොරටුවෙන් ගලවලා අයින් කරන සටනට අද පලවෙනි වෙඩි මුරය පත්තු කරලා සටන පටන් ගමු. ඒ සටනට ශක්තියක් වෙන්න අනිවාර්ය්‍යයෙයන් අපි ඉන්නවා. ඒ නිසා අපි ගෞරවයෙන් ඉල්ලනවා මේ යෝජනාවට ගරු කරන ගමන් මොරටුවෙන් මේ පවුල් විනාශ කරන, අනාගත පරම්පරාව විනාශ කරන මුලු මහත් මනුෂ්‍ය සංහතිය විනාශ කරන මේ සුදුව මොරටුවෙන් අයින් කරමු කියන ගෞරවනිය ඉල්ලිම කරමින් නිහඩ වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මාලනි බුලත්සිංහල මහත්මියගේ ගීතයක කොටසකින් අවතීර්ණ වෙන්න කැමතියි.

" මළ පොතේ අකුරු බෑ කී මිනිසා ,
ඉංග්‍රිසි පත්තරයක් මුල සිටලා අගට බලනවා,
අග සිටලා මුලට බලනවා කොහෙන් ඉගෙන ගත්තද මන්දා,

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා මේ ඉදිරිපත් කරලා තියෙන යෝජනාව සරළ නැහැ. ඉතාමත් අභියෝග ජනක යෝජනාවක්. මේ යෝජනාව ඉදිරිපත් කිරිමෙන්ම ඔබතුමා උඩුගම් බලා පීනන්න සූදානම් වෙනවා කියන පණිවිඩය තමයි මේ යෝජනාව ඇතුලේ තියෙන්නේ. අශ්වයන්ට ඔට්ටු තබන සුදුවට විශාල ඉතිහාසයක් තියෙනවා. සුද්දාගේ කාලයේ සිට තමයි පටන් අරගෙන තියෙන්නේ.ඔවුන් විවිධ ආකාරයෙන් මේ රට හුරාගෙන කනවා.ණය දිලා, ඔවුන්ගේ නිශ්පාදනයන් බලහත් කාරයෙන් පටවලා ,ඉඩම් කොල්ලාකාලා ,රටවල් තුල යුද්ධ හදලා ඔය වගේ.මොරටුව තුල මාසික වැටුපක් ලබලා ජිවත් වන පිරිසට වඩා දෛනිකව ආදායමක් කරලා ජීවත් වන පිරිස මේ සුදුවට ඇබ්බැහි වෙලා ඉන්නේ. මම මේ යෝජනාවේ තියෙන පුලුල් වැදගත් කම සඳහා අදහස් දක්වන්නේ. මේ මුදල් වැඩි හරියක් යන්නේ අපේ රටට නොවෙයි පිට රටට. ඒකයි මම කිව්වේ සුද්දා අපිව හුරාගෙන කනවා කියලා. සාමාන්‍යයෙන් අපි රු.20/- ක් දිලා ලොතැරැයියක් ගත්තම ඒ මුදල කැරකෙන්නේ අපේ රට ඇතුලේ යම් සුබසාධන වැඩකුත් සිද්ධ වෙනවා. විවිධ දේවල් වලට උදවු කරනවා. නමුත් රේස් බයි රේස් වලින් මොකක්ද වෙන සැපය. අහිංසක මිනිසාගේ 50/- 100/- කොල්ල කාලා ඒක විදේශ රටවල සතෙක් දුවන දිහා බලාගෙන ඉදලා ඒ මුදල පරදිනවා වගේම එහි වැඩි ප්‍රමාණයක ප්‍රතිශතයක් යන්නේ විදේශ රට වලට. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි අපි දන්නවා මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉන්න කාලේ රට තුල විශාල ආන්දෝලනයක් තිබුනා කැසිනෝ වලින් විශාල හානියක් මේ රටට සිද්ධ වෙනවා කියලා.ඒ හැබැයි අපේ පොඩි මිනිසාට ගිහිල්ලා කරන්න පුලුවන් සෙල්ලමක් නොවෙයි ඒක. හැබැයි වඩාත් භයානකම බරපතලම සුරාකෑම සිද්ධ වෙන්නේ අහිංසකයගේ පොකට් එකට ගහනනේ මේ රේස් බයි රේස් කියන එක.ඒ නිසා ඔබතුමා මේ ගන්න ප්‍රයත්නයට අත් දෙකම ඔසවලා සහය දෙනවා විතරක් නොවෙයි මොරටුව ආසනය මේ ව්‍යසනයට එරෙහිව ඒ වෙඩි මුරය අපිට පත්තුකරන්න පුලුවන් වුනොත් අපි ඓතිහාසික කාර්යභාරයක් කලා කියලා අපි ඉතිහාසගත වෙයි ගරු

නගරාධිපතිතුමනි. විශේෂයෙන්ම මේ රේස් බයි රේස් ව්‍යසනයට එරෙහිව මොරටුව මහ නගර සභාවේ මන්ත්‍රිවරු 48 දෙනාම ජාතික අපරාධයක් ලෙස සලකලා මොරටුව ආසනය ආශිර්වාදයක් කරගෙන ඒකමතිකව රේස් බයි රේස් මොරටුවෙන් තුරන් කරන්න කියන යෝජනාවට ගරු කරමින් අත උස්සලා ඉතිහාස ගත වෙනවා ජාතික ව්‍යසනයක් මේ රටෙන් පරද්දන්න මොරටුවේ අපි පෙරමුණ ගත්තා කියන ආදර්ශයට ශක්තිය ධෛර්ය ඔබ සියලු දෙනාටත් ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් ගරු නගරාධිපතිතුමනි නැවත වතාවක් ඔබතුමාටත් සුභාශිංශන පලකරමින් යොජනාවට පක්ෂව අදහස් දැක්විම අවසන් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මහජන නියෝජිතයින් විදියට ගතයුතු ඉතාමත් හොඳ තීන්දුවක් තමයි මේ. බුදු දහමෙත් කියලා තියෙනවා මිනිසුන් දුකට පත්වෙන කරුනු 3 ක් ගැන. සුරාවෙන් , පරපණ නැසීමෙන්, ඒ හා සමානවම සුදුවෙන් දුකට පත්වෙනවා. ගරු නගරාධිපතිතුමනි මගේ කොට්ඨාශයෙත් තියෙනවා මේ ස්ථානයක්. එකේ තිබෙන සියලු කරුනු මම හොඳින් දකිනවා. ඒ අය ප්‍රසිද්ධ ස්ථාන තමයි මේ වගේ දේවල් වලට තෝරා ගන්නේ. පාසැල් යන දරුවන්ගේත් මෙය ඇස් වලට දකිනවා. අපි නොදන්නාවා වුනාට ඔවුනුත් නොයෙකුත් මාර්ග වලින් මේවාට ඇබ්බැහි වෙනවා. මගේ කොට්ඨාශයේ හිටියා ඉතාම අසරණ මනුෂ්‍යයෙක්. ඒ මනුෂ්‍යට කෝටි 5 ක දිනුමක් ඇදුනා. එක පුතෙකුට ලැබුනා ලක්ෂ 50 ක්. ඔහු ඒ ලක්ෂ 50 මාසයක් යනකොට ඉවර කලා. දැන් උන්මාදයකින් පෙලෙනවා. ඔය වගේ දේවල් අනන්තව තියෙනවා.කාන්තාවන් දරුවන් අසිමිතව අසරණ වෙනවා. ගරු නගරාධිපතිතුමනි මේක මොන අභියෝග ආවත් මේක තමයි ගතයුතුම ක්‍රියාව. විශේෂයෙන්ම කියන්න කැමතියි මීට වසරකට ආසන්න කාලයක් මගේ මුහුණු පොතේ මේ සම්බන්ධව අදහසක් පල කරා. බොහෝ දෙනෙක් ඒකට අදහස් පල කරා. ජනතාව එකට පෙල ගැසෙන්න කැමතියි කියලා ඒගොල්ලෝගේ පනිවිඩයේ තිබුනා. ගරු නගරාධිපතිතුමනි අපි සියලු දෙනාම එකතුව මේ යෝජනාව දිනවමු ජනතාව උපයන ආදායම ඔවුන්ගේම පරිහරණය සඳහා වියදම් කරන්න මෙය පිටුවහලක් වේවි.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා ගස් කපන නන්ද ගැන කිව්වට පස්සේ මට පොඩි අදහසක් මතුවුනා.

ඔට්ටු පොලේ රේස් - ගස් කපන නන්දෙ ප්ලේස්
පඩිය වුනා මිස්ප්ලේස් - ගෙදර අයට කේස්

ඒවගේම ගරු නගරාධිපතිතුමනි මේ පිලිබඳව සුනිල් එදිරිසිංහ ශූරින් කියනවා.

මිනිසකු පිට නැඟි අසරුවෙකි - ඒ බර ගෙයි වහලට බරකී
පාන්දරින් පැරදුනු ඒ මිනිසා - හැන්දෑවෙත් අසු පිටට නගී

විශේෂයෙන් ගරු නගරාධිපතිතුමනි, මේ ශෝචනීය තත්වය විශේෂයෙන් ක්ෂේත්‍ර කීපයක් හරහා ලංකාවට වගේම මොරටුවට වගේම මේ ආර්ථිකයට දරුවන්ට වගේම බලපාන කාරණයක් වෙලා තියෙනවා.මේ යෝජනාව අපිට ක්‍රියාත්මක කරන්න පුලුවන් වුනා නම් එක පැත්තකින් වටිනවා අනිත් පැත්තෙන් සේනක මන්ත්‍රිතුමා කිවුව විදියට අපේ පැත්තෙන් අපි ගන්න ප්‍රාදේශිය ක්‍රියා මාර්ග පුංචි පාර්ලිමේන්තුවෙන් ගන්න ක්‍රියා මාර්ග අපේ 225 දෙනෙක් ප්‍රජාතන්ත්‍රවාදය නියෝජනය කරන එකේ යම් විදියකින් පනත් එක්ක ගැටුමක් ඇතිවුනොත් ඒකත් නිරාකරනය කර ගන්න අපි සියලු දෙනාම කටයුතු කර ගත යුතුයි කියන එක පිලිබඳ මම මගේ අදහස ඉදිරිපත් කරන්න කැමතියි. මට මතකයි ඊටත් කලින් සමහර කාරණා ආරම්භ කරද්දි වැඩි දෙනෙක්ගේ

මේකට සහයෝගය නැහැ. ජෙම්ස් පැකර් ඇවිල්ලා කැසිනෝ ව්‍යාපාරය ඩී.ආර් විජේවර්ධන මාවත , කොළඹ විශ්ව විද්‍යාල මාවත, මුත්තයියා පෙදෙස මෙය ව්‍යාප්ත කරන්න පනතකින් ආණ්ඩුවේ සහයෝගය දෙනකොට ඒකට විරුද්ධව ආණ්ඩු පක්ෂයෙන් ඉදලා විරුද්ධව ජන්දය දුන්නේ චම්පික රණවක ඇමතිවරයාත් ඒවගේම රතන හාමුදුරුවොත් පමණයි. ඊට පස්සේ මෙය මතවාදයක් වශයෙන් ඇවිල්ලා මේක නියාමන පනතක් දක්වා ගේන්න. ඒ නියාමන පනතින් සිද්ධ වුනේ මේ තුලින් ඔවුන්ගේ විවිධ විවිධ ඉලක්ක තිබුනා, ඒ වගේම සිගරට් අලෙවි කරන අයගේ විෂන් එක තමයි තොල් දෙකක් තියෙන ඕනැම කෙනෙක්ට සිගරට් අලෙවි කරන්න තමයි ඒ අයගේ අලෙවි කරන ප්‍රතිපත්තිය. ඒවගේම මේකේ වයස් භේදයක් නැහැ අලුත් සම්ප්‍රදායට අනුව සල්ලි තමයි දෙයියන්ගේ මල්ලි කියලා ඒ ගරා ගැනිමේ ගරානාව තමයි ඔවුන්ගේ සම්ප්‍රදාය තියෙන්නේ. එදා ජෙම්ස් පැකර්ට ඔස්ට්‍රේලියාවේ ඉදලා දැවැන්ත මුදල් කන්දරාවක් ගේනකොට ඒක නැවත වතාවක් ජනතාවට වෙන පිඩනය අපට හරවන්න පුලුවන් වුනා ආණ්ඩු පක්ෂයේ පුංචි කණ්ඩායමක් විදියට. අද අපි සංතෝෂ වෙනවා ආණ්ඩු පක්ෂයේ ඉදලා සමස්ත පිරිසම එකතුවෙලා ඒවගේම විපක්ෂයත් එකතුවෙලා ස්ථාවර කර ගන්න පුලුවන් වුනොත් සුනිල් එදිරිසිංහ මහත්මයා ගිතයට අලුත් අර්ථ කතනයක් එකතු කරන්න අපට පුලුවන් වෙයි. එසේ කරන්න ශක්තිය ධෛර්ය ලැබෙන්න කියලා අපි ප්‍රාර්ථනා කරනවා.නගරාධිපතිතුමනි මට මතකයි මොරටුවේ ගව ඝාතනාගාර යෝජනාව මම ගේනකොට යෝජනාව ජයග්‍රහනය කරන්න සමහර වෙලාවට එවකට හිටපු මන්ත්‍රිවරුත් එය ස්ථිර කරපු මන්ත්‍රිවරුත් කිවුවා බෝධින්වහන්සේ කපලා මස් කඩය තියන්න කියලා.ඒක අපහසයකට කියනවා නොවෙයි.ඒ තරමට උවුන්ගේ දැඩි පීඩනයක් තිබුනා මේ කරුන සාර්ථක වෙන්නේ නැහැ. සමහර වෙලාවට මේකේ රැවුම් ගෙරවුම්,ආගිය අභිනය,ශාස්ත්‍රිය අභිනයෙන් අපිට තර්ජන ඉදිරිපත් කරා. අපි ඒ තර්ජන වලට බය වුනේ නැහැ. මොරටුවේ ජයග්‍රහනය වෙන්නේ ගරු නගරාධිපතිතුමනි එදා සොත්තිය බමුණා දුන්න කුසතන අටමිට අතුරපු බෝධිමුලයේ තමයි මැරෙන්න හිටපු හරක් ගැට ගහැව්වේ. එදා බුදුරජානන් වහන්සේ අනිමිස පුජාව කරපු සමාන දුරකින් තමයි හරක් මැරුනේ. එදා සුජාතා සිටු දේවිය දුන්නු කිරිපිඩු පාත්‍රය උඩුගම් බලා යද්දි මොරටුව බොල්ගොඩ ගඟ පුරා පැතිරුනේ හරක්ගේ ලේ. ඒ නිසා ඒක අපිට නැවත වතාවක් හරවන්න ශක්තිමත් අදහස ඒ අභය දානය දෙන්න පුලුවන් කමක් ඇති වුනා අපට. හරක් 27 ත් මැරිච්ච මොරටුවේ මැරෙන්න නැති තැනට පත් කරන්න යෝජනාව ගෙනාපු කෙනෙක් විදියටත් ඒවගේම නගර සභාව එයට ශක්තිය දුන්න සියලු දෙනාටත් අපි ස්තුතිවන්ත වෙනවා. ඒ වගේම මොරටුවේ ඉන්නවා කුඩු බොන තරුණයෝ දහසක්. ඒවායේ එක එක වර්ග තියෙනවා. ඒවා නැතුව සාමාන්‍ය ඒවා පාවිච්චි කරනවා දවසට ලක්ෂ 20 ක.ඒ තරුණයෝ ඉන්න තැන් වලට කියනවා හොර පොට් කියලා. මාසෙට කෝටි 6 යි.අවුරුද්දට කෝටි 72 යි. ලංකාවේ ඉන්නවා හැත්තැදහසක් කෝටි පන්දාස් පන්සිය අනුවක කුඩු ගහනවා අර කියපු හෙරොයින් විතරක්.ලංකාවේ සමස්ත ආදායමෙන් තරුණයෝ වියදම් කරන්නේ විශාල ප්‍රමාණයක් ඒකට . මේක අපි වර්ධනය කරනවා වගේම මේකත් මර්ධනය කරලා තරුණයෝ බේර ගන්න. ශක්තිය ධෛර්ය ලැබෙවා කියා ප්‍රාර්ථනා කරමින් නිහඩ වෙනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - පී.ගාවින් මත්තෙස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා ඉදිරිපත් කරලා තියෙන මේ යෝජනාව මා බොහොම අගය කරනවා. අපේ අදහස් දක්වපු මන්ත්‍රිවරු ප්‍රකාශ කලා ඉතා වැදගත් ඒවා. මම හොඳට බලලා තියෙනවා 13 න් අවුරුද්දක් මේ පුටුවේ වාඩිවෙලා ඉදලා කරපු දේවල් මොනවද කියලා. තමුන්නාන්සේ අත ගහපු කිසි දෙයක් පස්සට ගියේ නැහැ කියන අදහස හිතේ තියෙනවා. තමුන්නාන්සේ ලේසි ගේම් එකක් නොවෙයි පටන් අරගෙන තියෙන්නේ.එය ඉදිරියට ගෙනියන්න අපේ සිටින ගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා සියලුම ඇමති මණ්ඩලේ තමුන්නාසේ එක්ක ඉන්නවා. තමුන්නාන්සේ මොරටුවේ ප්‍රධාන සංවිධායක වශයෙන්,පොදු ජන පෙරමුණේ කටයුතු කරනවා තමුන්නාන්සේට පමණයි මේ කරනවානම් කරන්නත් පුලුවන්. මේ දේ කරන්න පුලුවන් තවත් කෙනෙක් මොරටුවේ ඉපදෙන්නේ නැහැ. තමුන්නාන්සේ පටන් ගත්ත කිසිම දෙයක් දෙවැනි කලේ නැහැ හරියාකරව ඉටු කලා එය මන්ත්‍රිවරුන්ගෙන් කියවුනා. තමුන්නාන්සේ ට මේ මන්ත්‍රි මණ්ඩලය පමණක් නොවෙයි බණ්ඩාරනායකතුමා කියපු සභ, වෙද, ගුරු, ගොවි, කම්කරු

පංච මහා බලවේගයම තමුන්නාන්සේගේ පස්සෙන් ඉන්නවා. මොරටුව අසරණ ජනතාව බේර ගන්න,ජනතාවගේ පවුල් බේර ගන්න,මොරටුවේ දරුවන් උගත් බුද්ධිමත් දරුවන් ලෙස පත් කර ගන්න තමුන්නාන්සේ ගත්ත මේ පියවර අති ශ්‍රේෂ්ඨයි. එමනිසා අපගේ සහයෝගය දිවිහිමියෙන් දෙනවා කියලා මම පොරොන්දු වෙනවා. මේ රේස් බයි රේස් නැති කරන්න අතිගරු ජනාධිපතිතුමාගේ සිට සියලුම දෙනාට ශක්තිය ධෛර්ය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාවට විවාදයක් නැහැ හැම දෙනාම එකඟයි. පොඩි ගැටලුවකට තියෙන්නේ යෝජනාවේ අන්තර්ගතය තියෙන්නේ සභාවේ ආදායම වුන රේස් බයි රේස් නතර කිරිමට ව්‍යාපාර ආයතන වලින් 2021 අවුරුද්දේ ව්‍යාපාර බදු අය නොකිරිම කියන යෝජනාව. මේ යෝජනාවේ හරය එන්නේ මේ ස්ථාන වලින් අපි බදු අය කරන එක නවත්වමු. දැන් අපට තියෙන ගැටලුව තමයි අපි කවුරුත් එකඟයි රේස් බයි රේස් නවත්වන්න. ඒකට පක්ෂ නොවන කිසිවෙක් මේ සභාවේ නැහැ.එක විටක මම මේ සභාවට ගෙනත් පෙන්නුවා විට් එකක්. එකේ හිටියා අශ්වයෝ,බලලෝ හිටියා. ඒ බල්ලෝ හිටියා අපේ ක්‍රිඩකයන්ගේ නම් වලින්. ලසිත් මාලිංග නම් කරලා තිබුනා දුවන බල්ලෙකුට. මම රංගන හේරත් මහත්මයාට පුද්ගලිකවත් කථා කලා. ඒ නිසා අපි කවුරුත් දන්නවා මහා පරිමාන ජාවාරම්කාර ව්‍යාපාරිකයෝ රටට, ජනතාවට හෙණ ගැහැවුවත් තමන්ගේ ආදායම ඉහල දමා ගැනිම වෙනුවෙන් කටයුතු කරනවා.මේ කටයුතු කරන මිනිස්සු කවුද, ඉන්නේ කොහෙද,තනතුරු මොනවද, අපිට තියෙන ප්‍රශ්ණය ඒක. කාලයක් බොහොම ලගින්, සම්පව , කරට අතදාගෙන ඉඩ හැදුවේ මේ රට පාලනය කරපු පාලකයෝ. මාරුවෙන් මාරුවට. මේ රටේ ප්‍රධාන වගකිව යුතු අමාත්‍යාංශ හොබවපු අය. දැන් අපිට තිබෙන ගැටලුව තමයි මොරටුව මහ නගර සභාව විදියට ඔවුන්ට බලපත්‍ර නිකුත් කරන රජය පැත්තෙන් අපට කිසිදු විශ්වාසනීයත්වයක් නැති තත්වයක් තුල අපි යෝජනා කරනවා අපේ බලපත්‍ර නොගෙන ඉන්න. ඔබ මේ අභියෝගය භාර ගන්න එක ඉතා හොඳ එකක්. ඒ වෙනුවෙන් අපට කල හැක්කේ මොකක් ද අපි ඒ ශක්තිය දෙනවා. කිසි විවාදයක් නැහැ. හැබැයි ගැටලුව එන්නේ ප්‍රශ්ණය තියෙන්නේ කමක් නැහැ බයි 10-12 ක් තියෙයි ඕකෙන් පන්දාස් ගාන ආවත් පොඩි ආදායමක් අපිට ඒක පියවා ගන්න ලොකු අමාරුවක් කියන එක නොවෙයි හැබැයි මේවා පවත්වාගෙන යන්න රජය බලපත්‍ර තියෙද්දි අපි අපේ ආදායම නතර කර ගැනිමෙන් මම කියන්නේ සෙතක් නැහැ. ඒ ලක්ෂ 1 ½ ක් - 2 ක් අපිට අහිමි වීම කියන කාරණාව නොවෙයි. හැබැයි අපි කථා කරලා අපේ ආදායම පැත්ත මොකක් හරි ගානක් පරිත්‍යාග කරලා උත්සහ කරනවා වාද විවාද කරනවා ආණ්ඩුව පැත්තෙන් ලයිෂන් එක නිකුත් කරනවා. ඒ නිසා මේ විවාදයේදි අපිට වැදගත් වෙන්නේ ආණ්ඩුවේ අදාල අමාත්‍යාංශ මේ බලපත්‍ර නිකුත් කරන ඒ අමාත්‍යාංශ වලට අපි වහාම යවන්න ඕන මොරටුවේ ව්‍යාපාර පවත්වාගෙන යනවා නම් නගර සභාවේ බලපත්‍ර සහිතව වෙන්න ඕන.අපි බලපත්‍ර නොදෙන්න තින්දු කලා නම් අනිවාර්්යයෙන් අපි මේ රේස් බයි පවත්වාගෙන යන්න අවස්ථාව දෙන්නේ නැහැ කියලා කියන්න හයියක් මේ සභාවට තියෙන්න ඕන. අපි බලපත්‍ර නොදෙන කිසිදු ව්‍යාපාරයක් පවත්වාගෙන යන්න බලයක් නැහැ. හැබැයි අපි බලපත්‍ර නොදෙද්දි රේස් බයි පවත්වාගෙන ගියොත් නගරාධිපතිතුමනි ඔබ ප්‍රමුඛ මේ සභාව අභියෝගය දැන් අපි ඉස්සරහ තියෙන්නේ. මේ යෝජනාව සම්මත වීමන් මේ අභියෝගය අපි භාරඅරගෙන තියෙන්නේ. අපි බලපත්‍ර දෙන්නේ නැහැ දැන් මේක සම්මත වෙනවා. හැබැයි ආණ්ඩුව බලපත්‍ර දෙනවා බයි පවත්වාගෙන යන්න ඔවුන් පවත්වාගෙන ගියොත්. අපි වගකිම ගන්නවා අන්න මේ ප්‍රශ්ණය ඔබ ඉස්සරහ තියෙනවා. අපි හැල්ලු වෙනවද ,වැටෙනවද, අපි සභාවක් ලෙස අපිට ගත හැකි ඉහලම නීතිමය ක්‍රියාමාර්ග ඇතුලේ මට ඔන්න ඔය ගැටලුව තියෙනවා. බලෙන් ගොඩනැගිලි වලට පැනලා බලපත්‍ර නැහැ කියලා අපිට අයින් කිරිමේ හැකියාව තියෙනවද කියලා හිරවිමේ තත්වයක් තියෙනවා. ඒ නිසා අඩුම තරමේ නගරාධිපති විදියට ඉහල බලධාරින් එක්ක සාකච්ජා කරලා මම දන්නවා ගරු නගරාධිපතිතුමනි බණ්ඩාරගම පැත්තේ මස් කඩ නැහැ. අරක්කු විකුණන තැන නැහැ.මේ අදහස අරගෙන ගිහිල්ලා අදාල අමාත්‍යතුමා එක්ක සාකච්ජා කරලා මොරටුවෙන් මේක ඉවත් කරලා දෙන්න. අපි බලපත්‍ර ගන්නේ නැත්නම් අපිට එගොල්ලෝ එකග වෙන්න ඕන ඒ බලපත්‍ර අපි නොදෙන තැන්වල

ව්‍යාපාර කරගෙන යන්න බලපත්‍ර නොදෙන්න. අන්න ඒ ඉල්ලීම ඇතුලේ අපට ඒගොල්ලන්ට ඒ බලපත්‍ර මොරටු සීමාව ඇතුලේ නොදෙන්න කටයුතු කලොත් අපිට මේ කටයුතු වල අභියෝගයට අපි හිතනවා ඔබ මුණදෙයි. බොහොම හොඳයි අපි කවුරුත් කැමතියි. මේක මතුවෙන්න බලපාපු කාරනා මොනවා වුනත් දැන් සමහර මන්ත්‍රීවරු කථා කරන කොට අපිට වෙන වෙන අදහසුත් ආවා. යෝජනාවට 1000% ක් එකඟයි. හැබැයි අදහස් පලකරන සමහර මන්ත්‍රීවරු ඔවුන්ට තිබෙන විවිධ ඉතිහාස අපි දන්න නිසා විවිධ පෞද්ගලික වේදනාවල් මේ යෝජනාවට අන්තර්ගත කර ගන්නවා. කමක් නැහැ. එහෙම ගැටලුවක් නැහැ අපි ඔවුන් ගැන දන්න නිසා.මේක හොඳ දෙයක්. ජනතා විමුක්ති පෙරමුණ විදියට අපේ පක්ෂපාතිත්වය මේ යෝජනාවට පල කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමා අදහස් ප්‍රකාශ කලා වගේ නගරාධිපතිතුමා අපිට පොඩි සංශෝධනයක් කර ගන්න පුලුවන් නම් ලොකු වටිනාකමක් තියෙනවා. අපි ව්‍යාපාර බදු නොගන්නවා කියන්නේ මේකට විසඳුමක් නොවෙයි.නමුත් අපි ගත්තේ නැතත් එගොල්ලන්ට ව්‍යාපාරය පවත්වාගෙන යන්න පුලුවන්. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා පොඩි සංශෝධනයක් කරන්න කියලා.නැත්නම් අපි බදු මුදල් නොගෙන සිටියි. ව්‍යාපාරය කරගෙන යයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කිරීම තුල ස්තුතිවන්ත වෙනවා. අපි ඔබතුමාලා නියෝජනය කරන විල්ලෝරාවත්ත ප්‍රදේශය. අද මොරටුමුල්ල පුවක් අරඹ හන්දියෙන් පටන් ගත්තම මීටර් 100 ය 100 තැන් 3 ක වැඩියෙන්ම මිනිසුන් පීඩනයට පත් වෙන්නේ අපේ ප්‍රදේශය. අද රේස් බයි දෙකක එනවා රට හෙට උදේට දෙන්න ණය දෙනවා. රු.50000/- ක් වෙනකම් ණය දෙනවා අපේ කිප දෙනෙකුට. නම කියන්නේ නැහැ. හැබැයි ඒගොල්ලෝ දිනන සල්ලිත් ඒවගෙයි. ඉඩම් ගත්තා බයිසිකල් ගත්තා. එහෙම අරගෙන සති දෙකක් ගියේ නැහැ. ඉඩම් වික්කා බයිසිකල් වික්කා අද මුකුත් නැහැ ඒවා. අන්න ඒ ආකාරයේ තත්වයක් තමයි ඒ අයට වෙන්නේ. නිශාන්ත මන්ත්‍රීතුමා කිව්වා වගේ ක්‍රීඩකයින්ගේ නම් දාලා තියෙනවා. මුලින්ම රේස් බයි එකට එන කට්ටියට බයිට් එක්ක පොඩි ෂොට් එකක් දුන්නා ඒගොල්ලන්ව ගෙන්න ගන්න. දැන් ඒවා නැහැ.වඩුවා නන්නත්තාර වුනේ මේ කේස් එක නිසා. ඒගොල්ලෝ ගෙදර යන්නේ අශ්වයාගේ අම්මට බැන බැන. අන්න එහෙම යුගයක් අපි ජීවත් වන ප්‍රදේශයේ එන්නේ. ගවඝාතක පනතක් තියෙද්දි පාර්ලිමේන්තුවේ අපි මෙහෙ නැති කලානම් අපිට මේක නැතිකර ගන්න බැරි වෙන එකක් නැහැ. බදු නැවැත්තුවාම අපිට අහිමි වෙන්නේ රු.5000/- යි. ඒ ගැන නොහිතා කොහොම හරි නවත්වමු කියන ස්ථිර අදිටනින් යුතුව ක්‍රියා කරමින් නැවත වතාවක් මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධව සුභාශිංශන කරමින් නිහඬ වෙනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, යෝජනාවට පිලිතුරු කථාව කිරීමට අවසර පතනවා. විශේෂයෙන්ම මම විශ්වාස කරනවා ගාවින් මත්තෙස් මන්ත්‍රීතුමා ප්‍රකාශ කරා අභියෝගයක් භාර ගැනීම පිලිබඳව මගේ ජීවිතයේ මම අභියෝග වලට මුණ දීලා අභියෝග භාර අරගෙන ඒවා සක්‍රියව ක්‍රියා කරමින් ඒ කටයුතු කලා කියලා මගේ මතකය අවදි කරනවා. විශේෂයෙන්ම අවුරුදු 125 ක් තිබුන පැරණි ගවයන් මරණ ස්ථානය නතර කිරීම සඳහා මම මීට අවුරුදු 8 -10 කට පෙරදි ගත්ත තීරණය අද වෙනකොට වර්තමානයේ රජයක් විසින් ක්‍රියාවට නගන්න තරමටම සක්‍රිය වෙලා තියෙනවා. ඒ විතරක් නොවෙයි ඒ අවස්ථාවේදි පොලිසියේ එස් අයි මහත්මයා අපිව දාලා දුවනකොට සජිත් දුමින්ද පිරිස් මන්ත්‍රීතුමා විතරයි මාත් එක්ක හිටියේ මට තාම මතකයි. මම අතින් අල්ලලා එස් අයි මහත්මයාට කිව්වා කරුණාකරලා මෙතන ඉන්න කියලා. එතුමා ගියේ නැහැ අපි දෙන්නා කොහොම හරි ඒක කඩාගෙන ඉවර කරලා මරණ තැන නැති කලා. ඒ විතරක් නොවෙයි මට මතකයි අවුරුද්ද දවසක සුජිත් පුෂ්ප කුමාර මන්ත්‍රීතුමාත් මමත් ගිහිල්ලා අවුරුද්ද දවසේ කුණු

ගොඩවල් මිනිස්සුන්ට දකින්න හොඳ නැති නිසා අස් කරන්න යනකොට පොඩි බහින් බස් වීමක් වෙලා අපි දන්නේ නැහැ ඒගොල්ලෝ කවුද කියලා කුණු පාරට දාන ඒක නතර කරන්න ගිහිල්ලා මොරටුවැල්ලේ ඒ වාහනය අපි හරස් කරලා නැවැත්තුවාම ටී 56 හතරක් අරගෙන බහිනකොට මිනිස්සු ඔලුවට අත තියාගෙන හිටියා දැන් වෙඩි තියයි කියලා බලනකොට මහජන බැංකුවේ සල්ලි අරන් එන එක තමයි නතර කරලා තියෙන්නේ ඔවුන් හිතුවේ අපි නගරාධිපති නොවෙයි කියලා වෙඩි තියන්න ඔන්න මෙන්න තියෙද්දි ඒක බේර ගත්තා. හැබැයි මට ඕනකම තිබුනේ හරියටම අවුරුද්ද දවසේ සරමක් අදින්න ඕන නිසා මම සරමකුත් ඇදගෙන හිටියේ හැබැයි ඒකෙන් ජයග්‍රහනය කලා. අද කුණු නැති නගරයක් බවට පත්වුනා. තිලකසිරි මන්ත්‍රීතුමා යෝජනාවට යම් දෙයක් එකතු කලා විශේෂයෙන්ම මහරගම ගාමිණී විජේසේකර මැතිතුමා එක්සත් ජාතික පක්ෂයේ පතාක යෝධයෙක් එතුමා බෞද්ධ දර්ශනය පිලිබදව අතිශයම විශ්වාසය තබන අන්‍යාගම් වලට ගරු කරන මැතිතුමා මහරගමට ඒ දවස් වල යම් යම් තැන්වල එකක් වෙන්කොට 10 ක් දානකොට එතුමා එකක්වත් දාන්න නොදී ඒ කටයුත්ත කලා මට මතකයි. ඒ වගේ තැන් ඕන තරම් තියෙද්දි අපි බැරි වෙලාවත් තිලකසිරි මන්ත්‍රිතුමා මේ මුදල සභාවේ ගේන යෝජනාවක් විදියට සභාවේ විරෝධතාවය මුලින්ම ප්‍රකාශ කිරිම නිසාම තමයි සභාවට අය කරන බදු මුදල අය නොකිරිමට කටයුතු කරන්නට ඕන. එහෙම කරලා තමයි අපි ආරම්භ කරන්නට ඕන.එහෙම ආරම්භ නොකලොත් සභාව බදු මුදල අරගෙන මේකට ඔබ අනුමැතිය දිලා මුදල් අය කරගෙන ඔබ කියනවද අපිට මේක නවත්වන්න කියලා නීතිමය ප්‍රශ්ණයක් එන නිසා තමයි බදු මුදල් අය කිරිම නතර කලොත් අපිට පුලුවන් ව්‍යාපාරයට පොඩි තහංචියක් පමුනුවන්න ඒ නිසයි බදු මුදල් නතර කිරිම කියලා මම හිතන්නේ මම යෝජනාවට ඇතුලත් කලේ. ඒක නොකර අපි කරන්න ගියොත් අපි සදාචාර සම්පන්න නොවන සභාවක් බවට පත් වෙනවා. මම හිතනවා මුලු ඔක්කොම එකතුව ගත්තත් ලක්ෂ 1 ½ ක් වත් අපිට එකතු කර ගන්න බැහැ. නමුත් දවසකට ලක්ෂ 150 ක් විතර මේ හැම තැනම. සමහර විට පරදින්න පුළුවන් හැබැයි ලක්ෂ 25 නම් ඉක්මවා යන එක අනිවාර්◌්යයෙන්ම සිදු වෙනවා. ඒ නිසා මම විශ්වාස කරනවා සමහර වෙලාවට මෙතනට ඇවිල්ලා වරිපනම් වලට අදෝනා දෙන ව්‍යාපාරික බදු වලට රු.350/- දෙන එකට අදෝනා දෙන අය එක දවසකට රුපියල් 5000/- 10000/- පැරදිලා යන අවස්ථා තියෙනවා. මම හිතනවා මේ සියලු දේ කල්පනා කරන්න. ඒක නිසා මම විශ්වාස කරනවා මේ තත්වය ඉතාමත්ම නරක තත්වයක්. මට මතකයි මෛත්‍රිපාල සිරිසේන ජනාධිපතිතුමා සිගරැට් එකට තහංචි දැම්මට වඩා සිගරැට් එක බිමේදි වෙන්නාවූ පල විපාකය තුල වෙන්නාවූ කාරණය සිගරැට් පෙට්ටියට අන්තර්ගත කලා. ඒ නිසා අපිට පුලුවන් වෙනවා සිගරැට් බිම නතර කරන්න කියන පනිවිඩය සිගරැට් පැකට් එකට ඇතුලත් කරන්න. ඒ නිසාම තමයි මේ ව්‍යාපාරය රේස් බයි රේස් නතර කිරිම සඳහා අපි ගෙනියන වැඩ සටහනට මුලින්ම දායක වෙන්න ඕන ආයතනය විදියට නගර සභාව අපි ඒ බදු මුදල අය නොකිරිමට කටයුතු කරන්නට ඕන. ඒ නිසා අපි සියලු දෙනා මේ තුල කල්පනා කරලා මේ සියලු දෙනා මේකට එකඟයි. මම හිතනවා ඒ එකඟතාවය තුල අපි ලබාගත් ජයග්‍රහණ ගොඩක් තියෙනවා. ගරු සේනක දමයන්ත මගේ විපක්ෂනායකතුමා, නිශාන්ත ප්‍රදීනාන්දු මන්ත්‍රිතුමා, හිටපු පලාත් සභා මන්ත්‍රිතුමා,උප නගරාධිපතිතුමා ඇතුලු වන්නාවූ සියලු දෙනා හිටපු ජනාධිපතිතුමා මඩු වහන්න යනකොට අපි සියලු දෙනා ඒකට ඒ සඳහා එකම ආණ්ඩු පක්ෂය නියෝජනය කලත් එතුමා ඒකට දායකත්වය දිලා අපි එතකොට ආණ්ඩු පක්ෂයේ නුනත් මහ නගර සභාවේ නගරාධිපතිවරයා විදියට ඒ කටයුත්ත කරනකොට මටත් වඩා අඩියක් වත් පස්සට තියන්නේ නැතුව ඉස්සරහට තියලා ඒ කටයුත්තේ නායකත්වය දිලා ඒ විතරක් නොවෙයි මාව අට්ටාලයෙන් බිමට දාන්න ඒ අවශ්‍ය ම වන ලියුම ගේන්නත් එතුමා මොන වෙලාවකවත් පැකිලුනේ නැහැ. මම හිතනවා මෙතන තියෙන්නේ කවුද කරන්නේ කියන එක නොවෙයි කල යුත්තේ මොකක්ද කියන එක කවුද, හරි කියන එක නොවෙයි මොකක්ද හරි කියලා හොයන්නයි කාලය උදාවෙලා තියෙන්නේ. ඒ නිසා මේ නතර කිරිමට මහ ලොකු කාර්යයක් නොවෙයි. රේස් බයි රේස් වලට ගෙදර නෝනත්, තාත්තා රේස් බයි රේස් යන්නැත්නම් තාත්තත් දරුවනුත් මේකට එකතු වෙන්නේ කරන ගෙදරට වඩා නොයන ගෙදර අයත් මේකට එකතු කරලා අපේ හඩ විවර කලා නම් මම හිතනවා ඔය කියන අය වෙන තැනක දාගත්තට අපිට කමක් නැත. ඒ අය ඒ තීන්දුව ගත්තාවේ අපේ තින්දුව තුල අපි කටයුතු කරන්නට ඒ තරම් ලොකු ප්‍රශ්ණයක් නැහැ.

එහෙම වෙලා අදටත් නැති ඒවා නිශාන්ත ප්‍රදීනාන්දු මන්ත්‍රීතුමා මතක් කලා. ඒ වගේ මගේ සහෝදර මන්ත්‍රීවරු මතක් කලා.

ඒ මතක් කිරීම තුල අපි ආවර්ජනය කලාම හරි අපි යන්නේ මොරටුවේ කටයුත්තට නායාකත්වය දෙන්න මිසක් ලංකාවකට නායකත්වය දෙන්න නොවෙයි. ලංකාවටම නායකත්වය මේ තුල ලැබෙන්නට පුලුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.මිනිස්සුන්ට හම්බකර ගන්න ඕන තරම් ක්‍රමවේද තියෙනවා. හැබැයි මිනිස්සුන්ට නැති වෙන්න යම් යම් විදියකට අවශ්‍ය කරන පසුබිම හදන්න මහජන නියෝජිතයෝ අපිට බැරිනම් මම හිතනවා ඒක මහත් වූ අපේ නොහැකියාවක් බවට පත් වේවි. ඒ නිසා අපි සියලු දෙනා අපේ සෞඛ්‍ය කම්කරුවො අපි මොන තින්දු ගත්තත් සෞඛ්‍ය කම්කරුවෝ ටික එකතු වෙලා කළමනාකරණය කරලා කසල ගේනවා වගේම පොලිතින් ටිකත් ගෙනල්ලා දැන් කැට කරන්න පටන් අරගෙන තියෙනකොට මට මතක් වෙනවා ගරු සේනක දමයන්ත මැතිතුමා මහා විලක් විදියට මේක හරියටම පැය 72 ක් වර්ෂාවෙන් යටවෙලා තියෙද්දි වයින් ස්ටෝර්ස් එකක් දාන්න ලහි-ලහියේ හදනකොට කුණු බක්කි දෙකක් එතන තියලා පනුවෝ කෝටි ගානක් හදලා වයින් ස්ටෝර්ස් එකටත් පණුවෝ ගිහිල්ලා අපි එතන අපේ සේවකයොත් අරගෙන යම් කිසි පිකටින් එකක් කලාට පස්සේ මට විරුද්ධව ලක්ෂ 200 ක වන්දියක් ඉල්ලලා නඩුවක් දැම්මා නඩුවට වුනේ මොකක්ද කියලා වත් මම තාම දන්නේ නැහැ මට නම් මුකුත් වුනේ නැහැ. හැබැයි වයින් ස්ටෝර්ස් එක දැම්මා අපි ඊට වඩා ජවයක් අරගෙන මේ කටයුත්ත කරන්නට ඕන මම හිතනවා ඒ වගේමයි ඔය මස් කඩේ නතර කරන කොට ලක්ෂ 500 ක් ඉල්ලලා මහාධිකරණයේද කොහෙද නඩුවක් දැම්මා මම දන්නේ නැහැ තාම තියෙනවද කියලා හැබැයි මම මෙතනම තාම ඉන්නවා මස් කඩේ නැහැ. ඒ නිසා මම විශ්වාස කරනවා අනිවාර්යයෙන්ම මේ සියලු මන්ත්‍රීවරු එක්ක එකතු වෙලා පාරට ගන්න ඕන සියලුම ගෞරවනීය ස්වාමීන් වහන්සේලා, ගෞරවනීය පියතුමන්ලා, ගෞරවනීය දේවගැතිතුමන්ලා, ගෞරවනීය කුරක්කල් තුමන්ලා,ගෞරවනීය මව්ලවිතුමන්ලා අපි නායකත්වය දුන්නා මට මතකයි එදා අපි අට්ටාලය උඩ ඉන්නකොට කිසිම භේදයක් නැතිව ඒ.ටී.ආරියරත්න මැතිතුමා ආවා, මහ නායකතුමන්ලා ආවා, පියතුමන්ලා ආවා, දේවගැතිතුමන්ලා ඒ සියලුම දෙනා ඇවිල්ලා මාධ්‍ය සාකච්ජා පවා තියලා අපිට ධෛර්ය,ශක්තිය දුන්නා ඒ නිසා ආගමික නායකයින්ට මුල්තැන දිලා අපි මහජන නියෝජිතයෝ විදියට මේ කටයුත්තට පණ දුන්නොත් මම හිතනවා ඒක එච්චර ලොකු දෙයක් නොවෙයි අපි බලවත් සේ අපේ විරෝධය පාලා ඒක නවත්වන හදනකොට රජයට පුලුවන් වෙන්නේ මෙතනින් අයින් කර ගන්න කියන එක විතරයි එහෙම නැත්නම් බලපෑම කර කර ව්‍යාපාර පවත්වාගෙන යන්න ඒ පලාත් පාලන ආයතනය විරෝධතාවය තියෙනවා නම් ඒක කරන්න පුලුවන් කමක් කාටවත් නැහැ. ඒහෙම විරෝධතාවයක් තිබුන ඒවා අයින් වුන දේවල් ඕනතරම් තියෙනවා නැතුව නොවෙයි. ඒක නිසා මේ සියලු දේ කරන්නට 2021 වර්ෂය තුල මේ සියලු දෙනාටම ඒක කරන්නට අවශ්‍ය වෙන්නාවු තව තවත් කරුණු එකතු කර ගනිමින් මේකට එකතු වෙන්න ලැබෙන්න කියන විශ්වාසය තබා ගනිමින් විශේෂයෙන්ම මේ සියලු දේ කිරීම සඳහා ඔබ සියලු දෙනාගෙම එකඟතාව ලැබේවායි කියලා පිළිතුරු කථාව නිමා කරමින් මගේ කථාව සමාප්ත කරනවා.

අංක 05(02) දරණ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06. 2020 දෙසැම්බර් ස්ථාවර කමිටු වාර්තා සලකා බැලීම.

## 06(1) 2020.12.11 දින පැවැති මුදල් කමිටු වාර්තාවේ කමිටු නිර්දේශයන් සලකා බැලීම.

මහ නගර සභා මන්ත්‍රී - එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුව එක්කම වරප්‍රසාද ප්‍රශ්ණයක් ඒ එක්කම යනවා.විශේෂයෙන්ම මේ දවස් වල චන්ද කොට්ඨාශ මට්ටමින් සංවර්ධන කටයුතු කරන්න කමිටු පත්කරගෙන යනවා. මේ කමිටුවල බලතල ක්‍රියාත්මක වෙද්දි මම හිතන්නේ මහජන නියෝජිතයින්ගේ සම්බන්ධ විමක් වෙනවා.මම අහනවා ඔබතුමාගෙන් පුවක්අරඹ කොට්ඨාශයේ මැතිවරණයෙන් තරඟ කරලා දිනපු පුද්ගලයා විදියට මට කිසිම කැඳවීමක් හෝ යෝජනා අදහසක් ගැනිමක් සිදු කිරිමක් වෙන්නේ නැහැ. ඒක ඔබතුමා දැනුවත්ව වෙනවද? නැත්නම් එහෙම අයින් කිරිමක් කරනවද.මට ප්‍රශ්ණයක් නැහැ. ඒක සදාචාරාත්මක අයිතියක් නැහැ මහජනතාවගේ ඡන්දයෙන් පත්වුනු පුද්ගලයෙකුට මම නොවෙන්න පුලුවන්. මාව අයින් කලත් අනිත් අයව අයින් කරන්න එපා කියන පදනමේ ඉන්නේ.ඒ නිසා මම කාවවත් පුද්ගලයෙක් ඒක්ක කථා කිරිමක් බලපොරොත්තු වෙන්නේ නැහැ නිසා මම හිතනවා ඒ සම්ප්‍රදාය හෝ ඒ මහජනතාවගෙ කැමැත්තෙන් පත්වුන පුද්ගලයා මොන පක්ෂයක් නියෝජනය කලත් මහ නගර සභාවේ සියලුම මන්ත්‍රිවරුන් විදියට. ඒ බලතලයක් මට තියෙනවා මේ වෙනකම් මට එහෙම දෙයක් ලැබිලත් නැහැ මගෙන් යෝජනාවක් වත් අරගෙනත් නැහැ කමිටුවට කැඳවිමක් කරලත් නැහැ කිසිම නිලධාරියෙක් දැනුවත් කිරිමක් කරලත් නැහැ. මම ඔබතුමාගෙන් අදහසක් දැනගන්න කැමතියි මොකක්ද මෙතන වුනේ කියන එක.

නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා

ගරු විපක්ෂනායක තුමා මම හිතනවා මේ වෙලාවේදි අපි පොඩ්ඩක් නීතියක් එහෙම නැත්නම් මොකක්ද කියන එකට වඩා අපි දිලා තියෙන්නේ මහ නගර සභාව තුල ඒ කොට්ඨාශයේ හඳුනා ගන්නා ලද යෝජනාවලට අපි මුලිකත්වය දිලා ඒ කටයුතු පවත්වාගෙන යනවා. අලුත් වැඩක් කරන්නට අපි කල්පනා කලා ඒ කරනකොට මම ප්‍රධානියෙක් විදියට මම ඔබතුමාට රෙස්පෙක්ට් කරන කෙනෙක් මට තේරුනේ නැහැ මේ ස්ථාවර කමිටු තුල ගොනු කරන බජට් මිසක් නගරාධිපතිවරයෙක්ගේ බජට් ලංකාවේ කිසිම සභාපතිවරයෙකුගේගේ බජට් ඉදිරිපත් වෙන්නේ නැහැ. ඉදිරිපත් වෙන්නේ ඒකාබද්ධ වෙන්නාවු කාරක සභාවල් වල යෝජනා එක්ක ඇතුලත් වන අයවැයක් ඒ ඇරෙන්න ඒකට ඇතුල් වෙන්නාවු යෝජනාත් එක්ක ඇතිවෙන අයවැය විතරයි ඉදිරිපත් වෙන්නේ. එකේ මම හිතනවා ප්‍රතිවිරෝධය දක්වලා තියෙන්නේ අයවැය ලේඛණයේ තියෙන යම් යම් සාධක වලට නම් ඒ සාධක ඉවත් කර ගැනිමට අපිට පුලුවක් කමක් තිබුනා. එක පැත්තකින් මට ලොකු ප්‍රශ්ණයක් වෙනවා විරුද්ධ වෙච්ච අයවැය ලේඛනයකට ප්‍රතිපාදන වෙන් කරන්නේ කොහොමද කියලා මට ලොකු ගැටලුවක් තියෙනවා. මේවා පාර්ලිමේන්තු සම්ප්‍රදාය ක්‍රියාත්මක වන තැන නොවෙයි පලාත් සභා ක්‍රියාත්මක වන තැනක් නොවෙයි මෙය පලාත් පාලන ආයතන ක්‍රියාත්මක වෙන වැඩ සටහනක්.මට ලොකු ප්‍රශ්ණයක් වෙනවා අයවැයකට විරුද්ධව ජන්දය දෙනකොට ඡන්දය දිපු අයට මුදල් වෙන් කරමින් කරනවට වඩා කොට්ඨාශයට මුදල් වෙන් කිරිමේ කටයුතු කිරිම  මම හිතනවා ප්‍රායෝගිකයි  කියලා. ඒක මම හිතනවා දැන් කොහෙම ගෙනාවත් අපි කොටඨාශයට මුදල් යෝජනා වෙන විදියට තමයි අපි කටයුතු කලෙත් මෙතෙක්.හැබැයි ලොකු ප්‍රශ්ණයක් තියෙනවා අපිට අපි යම්කිසි විදියට නම්‍යශිලි වෙනවට වඩා, මන්ත්‍රිවරුන්ගේ ආත්ම ගෞරවය එදා බජට් එක වෙලාවෙදි මම ගොඩක් බලාපොරොත්තු වුනේ මගේ අයවැයට සියලු දෙනා අත උස්සයි කියන චේතනාවක් මගේ තිබුනේ නැහැ මට ලොකු වුවමනාවක් තිබුනා ඒකේ තිබෙන වැරැද්ද එලියට අරගෙන ඒකට එකතු කරන්න තියෙන දේවල් කරා නම් මට තිබුනා හිතන්න ඕක ඔහොම නොවෙයි සේනක දමයන්ත මැතිතුමා අපි ඉන්ධන දිමනාව එකවරම, දුරකථන දිමනාව අවුරුද්දකට එක වරක් පමණයි අපි සම්මත කරන්නේ. එක කාලයක් තිබුනා මේ ගන්න දිමනාවටත් විරුද්ධ වෙනවා. මම කථා කරලම කිව්වා ඔය ගන්න

එකට විරුද්ධ වෙන්නේ නැතිව අයිතමයට විතරක් අනුමත කරන්න කියලා. දැන් ඒක අයින් කරලා තමයි මුදල් කමිටුවට එන්නේ. ඒක අපි පෝස්ටර් පවා ගැහැවුවා ඉන්ධන දීමනාව ගන්නවා ගන්න එකට විරුද්ධ වෙනවා මෙන්න මේ අය කියලා. අතුල පීරිස් මන්ත්‍රීතුමා මේකට ලඟි-ලඟියේ වැඩ කරනකොට නමක් දා ගන්න යම් යම් අය ගැහැව්වා. ඒක නිසා මට ලොකු ප්‍රශ්ණයක් වෙනවා වැඩ සටහනට විරුද්ධ වෙනවා. වැඩ සටහන ක්‍රියාත්මක කරන්න මුදල් දෙනකොට ඒකේ පරස්පරභාවයක් තියෙනවා. මේක පාර්ලිමේන්තු සම්ප්‍රදාය නොවෙයි ඒකනිසා මම ඔබතුමාට මේ දෙකම පිලිබඳව ඔබතුමාට ලොකු අවබෝධයක් තියෙන නිසා මම හිතනවා මාව තේරුම් ගන්න.

<u>මහ නගර සභා මන්ත්‍රී - එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පැහැදිලියි තමුන්නාන්සේගේ අදහස නමුත් පලාත් සභා අපි නියෝජනය කරන කාලේ පලාත් සභා බජට් එකට අපි සහයෝගය ලබා දෙන්නේ නැහැ පක්ෂයක් විදියට හැබැයි පලාත් සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ට එක හා සමාන සැලකිල්ලක් තියෙනවා. මේ සභාව නියෝජනය කරන සියලු මන්ත්‍රීවරුන්ගේ මහජනතාවයි ඡන්දය දෙන්නේ මහජනතාවයි බලාපොරොත්තු වෙන්නේ ඒ අයගේ සේවය. මෙතනදි සලකන්න බැහැ පක්ෂ විපක්ෂ භේදයක් විදියට සලකන්න නොවෙයි. මහජනතාව වැඩි ඡන්දයෙන් පත් කරලා සිටින පුද්ගලයට ඒ ගම නියෝජනය කරන පුද්ගලයා දිහා ඔබතුමා බලන්න ඕන. මහජනතාවට වගකියන්නේ මහජනතාව කැමැත්තෙන් පත් කරලා සිටින පුද්ගලයා. ඒ නිසා ඒ අයට ඒ අවස්ථාව ලබා දෙන්න මම හිතන්නේ නැහැ මේ සභා 2-3 ක් සිටියි වැඩිම වුනොත්. පලාත් සභා ජේනතෙක් මානෙක නැත්නම්.පලාත් සභා එනකම් තමයි මෙතන හිටියේ.වැඩි පුර මේ සභාව නියෝජනය කරන්න මගේ අදහසක් නැහැ පැහැදිලිවම. මේකට ඊලඟට නගරාධිපති කෙනෙක් වෙන්න අපේ කණ්ඩායමේ කෙනෙක් ඉන්නවා නම් ඒ අයට අවස්ථාව දෙන්න ඕන ඒ සඳහා සූදානම් වෙන්න. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ සභාවේ අපි අයවැයට විරුද්ධ වුනා කියලා ගත්තොත් තමුන්නාන්සේ දන්නවා ඒක දේශපාලනික වශයෙන් ගත්තොත් කේන්තියකින් පලිගැනීමක් කියන චේතනාවක් අපි තුල එනවා. එහෙම වෙන්න එපා.තමුන්නාසේව මේ තුන්වෙනි පාර නගරාධිපති ඊලඟ පාර තරග කරලා තමුන්නාන්සේ එනකොට ගමේ බැහැලා යනකොට මේ හැමෝගෙම නගරාධිපතිවරයා හැටියටයි තමුන්නාන්සේ යන්න වෙන්නේ. ඒ නිසා ඒ ආකල්පයෙන් බැහැරව දේශපාලන කෝණයකින් බලන්නේ නැතුව විපක්ෂයක් විදියට තමුන්නාන්සේ ඔය පැත්තේ වාඩිවෙලා හිටියොත් ආණ්ඩු පක්ෂයේ මේ පැත්තේ ඉන්න කොට තමුන්නාන්සේලාට විරුද්ධ වෙන්න අවස්ථාවල් තියෙනවා. මම එතකොට කියන්නේ නැහැ අපේ පැත්තේ හිටියේ එය පුටුවේ වැඩිවෙලා අපේ නගරාධිපතිවරයාටවත් මම කියන්නේ නැහැඒ විදියට කියන්නේ නැහැ.නමුත් සාධාරණය හැමෝටම තියෙන්න ඕන. ඒ නිසා ඒ ගැන කටයුතු කරන්න මම කිසිම මන්ත්‍රීවරයෙක් එක්ක අකමැත්තක් නැහැ.තමුන්නාන්සේගේ අදහස පැහැදිලියි. මුදල් කමිටුවේ මෙම අයිතමයන් සඳහා අපි එකග වෙනවා අංක 19, 20, 21, 23, 32, 37, 38, 40, 42(1), 42(2), 43,46 අනිත් ඒවා ප්‍රතික්ෂේප කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - පී.ගාවින් මත්තෙස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ මොරටුව දේශපාලන වශයෙන් මොරටුව ජනතාව කාබාසිනියා කලේ පැරිෂුට් කාරයෝ මොරටුවට ආවා. සංවර්ධන සමිති පිහිටුවාගෙන යනවා මොරටුව පුරාම. දොලවත්ත කියන මන්ත්‍රීතුමා ඒක පිහිටුවලා අපි ආරාධනා කරනවා සංවර්ධන නිලධාරි ලවා. අපි ඒකට යන්නේ නැහැ.තමුන්නාන්සේ සංවර්ධන කමිටු පිහිටුවන්න ඉස්සෙල්ලා දැනට මාස 1 ½ කට කලින් ලක්ෂ 10 ක් ප්‍රතිපාදන දෙනවා ශාඛාවක් පිහිටුවන්න කියලා. අන්න ඒක තමයි දුරදර්ශිව කටයුතු කරලා තියෙනවා කියලා අපිට ඇගෙවුවේ. සංවර්ධන නිලධාරි කියනවා ගමේ සංවර්ධන වැඩ ලියාගෙන ඇවිත් දොලවත්ත මහත්මයාට කියලා සංවර්ධනය කර ගන්න. පැරිෂුට් කාරයෝ එපා එනවා නම් ස්ථිර අය එන්න. යූ ඇන් පි එකෙත් පැරිෂුට් කාරයෝ අපිව කාලා ඉන්නේ.මොරටුවේ එක්කෙනෙක් මොරටුවට එන්න ඕන.මගේ පැතුම ඒකයි. තමුන්නාන්සේ තව ටික දිනකින් පාර්ලිමේන්තුව නියෝජනය කරනවා.මොරටු පුද්ගලයෙක් විදියට තමයි ඔබතුමා

යන්නේ. තමුන්නාන්සේ අවංකයි , නිහතමානයි, ගමට ලැදියි. මොරටුව ජනතාව පෝෂණය කරනවද ඒකයි අපේ පැතුම. නමුත් අරවත්ත දොලවත්තලා මේකට ඕන නැහැ.මගේ කථාව වරදවා තේරුම් ගන්න එපා.එක එක්කෙනාව මොරටුවට දාන්න එපා ඔබතුමාගෙන් කාරුනිකව ඉල්ලා සිටිනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුව සම්බන්ධව මතු වෙන කාරණාවක් නිසා,ඔබතුමාට යෝජනාවක් කරන්න කැමතියි. කසළ කළමනාකරනයට අනුව පොලිතින්,ප්ලාස්ටික් ටික හොල්සිම් ආයතනයට යනවා එතකොට අපට ලොකු ආදායමක් එකතු වෙනවා. පුනරාවර්ථන වියදමක් ඉතිරි වෙනවා ලක්ෂ 10 කට ආසන්න ප්‍රමාණයක්. මම දැක්කා තැන් කිපයක අපේ සෞඛ්‍ය සේවකයෝ මොරටුවේ ගෞරවය රකින පිරිසක් විදියට මම දකිනවා. ඔවුන් ජනතාව දෙන පොලිතින් ප්ලාස්ටික් ටික අරගෙන නැවත වතාවක් බිම දාගෙන වාඩිවෙලා ඉන්නවා.මම කියන්නේ ඔවුන් ඒකට අවතීර්ණ වෙලා නගරාධිපතිතුමනි. ඔවුන්ට රු.150/-ක දිමනාවක් ලබා දුන්නා. එම මුදල රු.200/- ක් කර ගන්න අපිට පුලුවන් කම ලැබුනොත් ඔවුන්ගේ අභිප්‍රේරණයට තව දුරටත් වැඩිවෙන්න හේතුවක් වෙයි. මම යෝජනා කරනවා 150/- මුදල 200/- ක් කරන්න කියලා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුව සම්බන්ධයෙන් පොදු අදහසක් අපි ඉදිරිපත් කරනවා. කාරනා වියුක්තව ගන්නේ නැතුව. අපට තවමත් අපේ මුදල් වියදම් පිලිබදව සෑහිමකට පත් වෙන්න බැහැ. එනිසා අපේ විරුද්ධ බව ඉදිරිපත් කරන්නේ ඉතා කෙටියෙන්. තවමත් මේ ලේඛණ වල අපිට ලබා නුදුන්නට සභාවක් විදියට අපි ඉන්නේ ලොකු ණය බරකින්. අඩුම තරමේ අපි මිලියන 80 කට එහා පැත්තේ ණයක ඉන්නේ. අපි සමහර අයිරා වලට යන්නේ ණය ගන්නේ සංවර්ධන ව්‍යාපෘති තමයි. ඒ ව්‍යාපෘති හොඳින් හොයලා බලපුවම සමහර ඒවා අත්‍යාවශ්‍ය ඒවාම නොවෙයි. අපි ඉන්න තත්වයත් එක්ක ගත්තම සමහර පාරවල් අත්‍යවශ්‍ය ඒවා නොවෙයි. එක පාරක ගියා තාප්ප දෙපැත්තෙම මීටර් 40 ක් විතර එක ගෙයක් වත් නැහැ. ගල් අල්ලලා. සති දෙකයි තාප්පයක් කඩාගෙන වැටුනා පාර උඩට. අපි වියදම් කල යුතු වඩාත් හොඳම කලමණාකරනයක් සහිතව නොවෙයි මූල්‍ය පැත්ත තියෙන්නේ. සමහර ව්‍යාපෘති එනවා ඒ මුදල් හම්බ කරන්න තිබෙන උවමනාවමද කියලා. මේ වාර්තාව ගත්තොත් 2019 සමුපකාරයෙන් ගත් තෙල් වල ගෙවීම් දැන් එනවා. ඒ නිසා ආයතනයක් ලෙස අපි තාම සමත් නැහැ මූල්‍ය කලමනාකරණයට. අපි පොදු ස්ථාන වලට ගියාම ඒවා හොඳින් ගලපාගෙන නැති නිසා අපි මුදල් කමිටුවට විරෝධය පල කරනවා. ඒවායේ ගොඩක් ප්‍රශ්ණ තියෙනවා අපි ඒවා ඇද ගන්න යන්නේ නැහැ. අහන්නම ඕන ඉදිරිපිට තියෙන විරපුරන්අප්පු ක්‍රිඩාංගනයේ අදාල ගොඩනැගිල්ල පිලිබදව අවධානය යොමු කරනවා. මේ පිලිබදව. මගේ අර්තයෙන් ගත්තොත් මම මේකට විරුද්ධයි. අපට තිබුන යහපත් ඉස්කෝලේ දරුවෝ හරි ඇවිල්ලා සෙල්ලම් කරන්න තිබුන අවස්ථාව නැති කරලා ඉදිකරපු ඉදිකිරිමක්. ඒ ඉදිකිරිම ඇතුලේ අපි ආදායමක් උපයනවා වෙනුවට ලක්ෂ ගානක ලයිට් බිලක් එනවා. අපිට කිව්වා සූර්ය ගැස් වලින් විදුලිය දෙනවා කියලා. ඒ නිසා වහාම සැලකිල්ලට ලක් කරන්න මේවා සභා වියදම් වලින් නඩත්තු කරනවාද අපි ඒවායින් අදායම් උත්පාදනය කරලා කියන එක සැලකිල්ලට ගනිමින් පොදුවේ ගත්තම මුදල් කමිටුවට අපි විරුද්ධ වෙනවා ගරු නගරාධිපතිතුමනි.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීවරුනි, අද දවසේදි පෙත්සම් අයිතමය යටතේ ඇති තරම් තමන්ගේ විරෝධතාවයන් සියලුම දේවල් කිව්වා. ලබන මාසේ වෙනකොට ගරු නිශාන්ත කණ්ඩායම් නායකතුමා ඔබතුමා අපිට කමිටු සඳහා ඕනෑම කෙනෙක්ව එවන්න අදහස් දැක්වීම සඳහා. ගරු මැක්සි මන්ත්‍රීතුමාට ඕනෑම කමිටුවකට ඇවිල්ලා අදහස් දැක්විය හැකියි. ඊලඟ සභා වාරයේදි අදාල අයිතමයන් කාලය ලබා දෙනවා .

<u>**මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, සමාවෙන්න ඔබතුමාගේ අවංක උත්සහායට අකුල් හෙලනවා නොවෙයි. ඒක හොඳයි කමිටු සක්‍රිය කර ගන්න ඕන. පණතේ තියෙන ප්‍රතිපාදන වලට අනුව ඡන්ද පාවිච්චි කරන්න බැහැ. ඕන මන්ත්‍රීවරයෙකුට කමිටුවට ඇවිල්ල අදහස් පල කරන්න පුලුවන්. හැබැයි මේ කමිටුවල පත්වෙන සභාපතිවරු අතිශය බරපතල ප්‍රශ්ණයක්. සභාපති සම්පූර්ණ කමිටුව නොසලකා හරිනවා. මේ කමිටුවේ තිබෙන හැම අයිතමයක් පිලිබඳවම ඉතා හොඳ අවබෝධයක දැනුමක ඔහු සභාවට එන්න ඕන. නැත්නම් අපි කොපමණ උත්සහ කලත් වැඩක් නැහැ. අපි ඒක අවධාරණය කරමු.

<u>**මහ නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, පුද්ගලික ස්වභාවයේ කරුණු වලට අපි හැමටම ලැබුනා මන්ත්‍රීවරයෙක් විදියට පත් වෙලා ලැබුනු එකම වරප්‍රසාදය පාසැල් දරුවන්ට අභ්‍යාස පොත් ඔබතුමා ලබා දුන්නා. මේ වසරේත් අභ්‍යාස පොත් ලැබෙනවද කියලා දැනගන්න කැමතියි.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය විතරක් නොවෙයි අපි සියලුම පක්ෂ වලට පෙත්සම් පැමිණිලි අයිතමය යටතේ කාලය දෙනවා අවසාන වශයෙන් පුද්ගලික කරුණු ඉදිරිපත් කිරිමටත් කාලයක් දෙනවා. ඒක න්‍යාය පත්‍රයට කාලයත් එක්කම එනවා.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, පැහැදිලිවම ඔව්. පාසැල් පටන් ගන්නට පෙර අපි දෙනවා.

<u>**මහ නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා ඉවත් කලා ගසක්. ඒකට මොකක්ද කලේ කියලා දැනගන්න කැමතියි. මම අත්සන් කරපු කෙනෙක් විදියට මමත් ඒකට වගකියන්න ඕන නිසා.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, ගස මෝලෙන් ඉරලා මේ වෙනකොට අපි ඉදිකිරිමක් කරනවා එකේ සොල්දරයකට සහා පඩිපෙලකට ගත්තා.

<u>**මහ නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රීතුමා මතක් කරපු කමිටු සම්බන්ධයෙන් ඒකට වැඩිමනත් වශයෙන් ඔබතුමා ආඥා පනත අනුව හොඳ තීරණයක් අපේ සභාවේ කාලය ඉතිරි කිරිම සඳහා ගත්තු තීරණය කමිටුවේදි සාකච්ජා කරන්න. එතුමා කිව්වා සභාපතිවරු ඒ

පිලිබඳව දැනුවත් වෙලා ඉන්නවා වගේම තමයි ගරු නගරාධිපතිතුමනි කමිටු සභාපති කෙනෙක් වශයෙන් මම අත්දැකපු කාරණයක් තමයි බොහෝ වෙලාවට කමිටුවට නිලධාරින්ගේ පැමිණීම සහ ඒ වාර්තා ඉදිරිපත් කිරීම බොහොම දුර්වල මට්ටමක තියෙන්නේ. ගරු නාගරික කොමසාරිස්තුමාගේ අවධානයත් යොමු කරනවා. ඔබතුමා ගන්න අවංක උත්සහය සාර්ථක කර ගන්න සමහර නිලධාරින් කමිටුවට ඇවිල්ලා තමයි වාර්තාව සුදානම් නැහැ පස්සේ දෙන්නම් ඒ වගේ කාරනා කියන්නේ. ඒ නිසා මන්ත්‍රිවරුත් ඒ පිලිබඳ අවධානය යොමු කරනවා වගේම නිලධාරිනුත් ඒ අවධානය යොමු කරනවා නම් අපි සියලු දෙනා එකතු වුනොත් මේ උත්සහය ඉතාම සාර්ථක කර ගන්න පුලුවන් කියලා මා විශ්වාස කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාට මා ආරම්භයේදි ඉඩම පිරිස් මාවතේ ගහ පිලිබඳ ප්‍රශ්ණයක් යොමු කලා එකේ පරණ බිම් කැබැල්ල පර්චස් 3.75 යි වර්තමානයේ පර්චස් 4 ½ කට වැඩියෙන් බිම්සවිය ඔප්පුවේ සඳහන් වෙලා තියෙනවා. මම අවශ්‍ය ලිපි ලේඛණ භාර දිලා තියෙනවා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, වීරපුරන් අප්පු චතුරශ්‍රයේ මතුවුන කාරණය තමයි සූර්ය කෝෂවල සක්‍රිය කරන එක කරලා නැෂනල් ක්රෙඩික්ට් එකට එකතු කරලා ඒ මුදලින් තමයි ඒක කරලා තිබුනේ. එතුමා කියපු අදහස ලක්ෂ ගානක් යනවද කියලා මම දන්නේ නැහැ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, කොරෝනා කාලේ ඒක ඔසඳ හර්ෂන මන්ත්‍රිතුමාටත් මේක බලපෑවා. ඒකට අවශ්‍ය කරන මීටර් ප්‍රමාණය ලැබීම බොහොම ප්‍රමාද වීමක් වුනා කොරෝනා නිසා. සූර්ය කෝෂයෙන් ගනිද්දි අපි ගන්න ප්‍රමාණය වගේම එලියට දාන ප්‍රමාණයත් එක්ක විදුලි පද්ධති ප්‍රමාණයත් එක්ක එලියට දෙන ප්‍රමාණයත් එක්ක මීටර් වෙන්න ඕන. ඒ මීටරය ප්‍රමාද වීමක් වෙලා තියෙනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපිට දිනපතා ලැබෙන පුවත් පත දැන් ටික කාලෙක සිට ලැබෙන්නේ නැහැ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, මේ සතිය අවසාන වෙනකොට පුවත්පත ලැබෙයි.

<u>මහ නගර සභා මන්ත්‍රී - සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කරුණාකරලා අපේ ඉන්ෂුවරන්ස් එක සම්බන්ධව කටයුතු කරන්න.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, සේනක දමයන්ත ගරු මන්ත්‍රිතුමා දන්නවා පලාත් සභාවෙත් ,පාර්ලිමේන්තුවෙත් ඒක කලා නම් අපිට ඒක පුලුවන් කියන තැන ඉන්නවා. හැබැයි මේකට පරික්ෂණයක් තියෙන නිසා අපේ යෝජනාව සක්‍රිය කරලා නැවත ආණ්ඩුකාර තුමා වෙත යොමුකරලා තනි තිරණයක් ගන්න තැනක් තියෙන නිසා මහ ඇමති කෙනෙක් නැහැ, මන්ත්‍රි මණ්ඩලයක් නැහැ, කැබිනට් එක්ක නැති නිසා එතුමාට කරුනු වාර්තා කලාම නිලධාරින් ඒකට එකඟ නිසා මම හිතනවා අපිට

ගන්න පුලුවන් කියලා මම හෙට-අනිද්දාම ගිහිල්ලා මේ කාරණය. ඉන්ෂුරන් එකක් මේ වගේ වසංගත කාල සීමාවක් තුල අතිශය වැදගත් වෙලා තියෙනවා ඒ සඳහා අවශ්‍ය කරන කටයුත්ත කරනවා.

2020.12.11 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.රන්දු නිරෝෂන මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී.සුසන්ත පෙරේරා මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා |

2020.12.11 දින මුදල් කමිටු වාර්තාවේ අංක19,අංක20, අංක21, අංක23, අංක32, අංක37, අංක38, අංක40, අංක42(1), අංක42,(2), අංක43, අංක 46 පක්ෂවත් අනිකුත් සියලුම කමිටු නිර්දේශයන් වලට විරුද්ධවත් පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.ගාවින් මත්තෙස් මහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා |

| | | | |
|---|---|---|---|
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුනිල් නන්දසිරි මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මැන්දිස් මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනි ප්‍රියන්තිකා කුරේ මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |

2020.12.11 දින මුදල් කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වලට විරුද්ධවත් පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් ජන්දය ප්‍රකාශ කරන ලදි.

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 02. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

2020.12.11 දින මුදල් කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ජන්දයෙන් සභා සම්මත විය.

07. **<u>2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා කාල සීමාවට අදාලව පහත සඳහන් ස්ථාවර කමිටු වලට සාමාජිකයින් පත් කිරිම.</u>**

07(1) ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරිම

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි,පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට තේරි පත් වී ඇති බව දන්වා සිටිනවා.

1. මහ නගර සභා මන්ත්‍රි - එම්.කේ.පී.සුසන්ත පෙරේරා මහතා
2. මහ නගර සභා මන්ත්‍රි - එම්.කුමාර රාජරත්න මහතා
3. මහ නගර සභා මන්ත්‍රි - සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා
4. මහ නගර සභා මන්ත්‍රි - පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා
5. මහ නගර සභා මන්ත්‍රි - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා
6. මහ නගර සභා මන්ත්‍රි - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය

07(2) මහජන උපයෝගිතා,කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරිම

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මහ නගර සභා මන්ත්‍රිවරුනි,පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රිවරුන් මහජන උපයෝගිතා, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටුවට තේරි පත් වී ඇති බව දන්වා සිටිනවා.

1. මහ නගර සභා මන්ත්‍රි - එම්.පිලිප් ෆැන්සිස් ප්‍රනාන්ද මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා
3. මහ නගර සභා මන්ත්‍රි - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා
4. මහ නගර සභා මන්ත්‍රි - එම්.නාලිනි ප්‍රේමවති ප්‍රනාන්දු මහත්මිය
5. මහ නගර සභා මන්ත්‍රි - ඩබ්.පී.ප්‍රභාෂිනි වික්‍රමසිංහ මහත්මිය
6. මහ නගර සභා මන්ත්‍රි - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය

07(3) ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරිම

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මහ නගර සභා මන්ත්‍රිවරුනි,පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රිවරුන් ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවට තේරි පත් වී ඇති බව දන්වා සිටිනවා.

1. මහ නගර සභා මන්ත්‍රි - පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා
2. මහ නගර සභා මන්ත්‍රි - එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය
3. මහ නගර සභා මන්ත්‍රි - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
4. මහ නගර සභා මන්ත්‍රි - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
5. මහ නගර සභා මන්ත්‍රි - සිත්ති මසීනා බක්කර් මහත්මිය
6. මහ නගර සභා මන්ත්‍රි - එම්.ලිහිණි ප්‍රනාන්දු මහත්මිය

07(4) පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරිම

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මහ නගර සභා මන්ත්‍රිවරුනි,පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රිවරුන් පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටුවට තේරි පත් වී ඇති බව දන්වා සිටිනවා.

1. මහ නගර සභා මන්ත්‍රි - එස්.වී.එම්.නීෂා ඉරානි විජේවික්‍රම මහත්මිය
2. මහ නගර සභා මන්ත්‍රි - එච්.ප්‍රදිප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා
3. මහ නගර සභා මන්ත්‍රි - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
4. මහ නගර සභා මන්ත්‍රි - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
5. මහ නගර සභා මන්ත්‍රි - ඩබ්.මැක්සි ජෙරාඩ් ප්‍රනාන්දු මහතා
6. මහ නගර සභා මන්ත්‍රි - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපොන්සු මහතා

07(5) ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරිම

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි,පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවට තේරි පත් වී ඇති බව දන්වා සිටිනවා.

1. මහ නගර සභා මන්ත්‍රී - කේ.ඕ.අනුර ප්‍රනාන්දු මහතා
2. මහ නගර සභා මන්ත්‍රී - යූ.ලලිත් ප්‍රනාන්දු මහතා
3. මහ නගර සභා මන්ත්‍රී - එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා
4. මහ නගර සභා මන්ත්‍රී - කේ.ඕ.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
5. මහ නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ඒ.දෝන දිලාශිනි මහත්මිය
6. මහ නගර සභා මන්ත්‍රී - ආර්.ක්‍රිෂනි ප්‍රනාන්දු මහත්මිය

07(6) ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමණාකරණය පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරිම

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි,පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමණාකරණය පිළිබඳ ස්ථාවර කමිටුවට තේරි පත් වී ඇති බව දන්වා සිටිනවා.

1. මහ නගර සභා මන්ත්‍රී - පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා
2. මහ නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
3. මහ නගර සභා මන්ත්‍රී - එෆ්.බී.නිලංක සිල්වා මහතා
4. මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා
5. මහ නගර සභා මන්ත්‍රී - රවිනාත් ජේ. ගුණසේකර මහතා
6. මහ නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරිස් මහතා

07(7) ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරිම

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි,පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටුවට තේරි පත් වී ඇති බව දන්වා සිටිනවා.

1. මහ නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා
2. මහ නගර සභා මන්ත්‍රී - එච්.උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා
3. මහ නගර සභා මන්ත්‍රී - ඩී.ඩබ්.රන්දු නිරෝෂන මහතා
4. මහ නගර සභා මන්ත්‍රී - යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා
5. මහ නගර සභා මන්ත්‍රී - එස්.බේසර රවින්ද්‍ර ප්‍රනාන්දු මහතා
6. මහ නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන ප්‍රනාන්දු මහතා

07(8) කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරීම

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි,පහත නම් සඳහන් මහ නගර සභා මන්ත්‍රීවරුන් කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ පිළිබඳ ස්ථාවර කමිටුවට තේරී පත් වී ඇති බව දන්වා සිටිනවා.

1. මහ නගර සභා මන්ත්‍රී - ඒ.දීපා චාන්දනි ආරියවංශ මහත්මිය
2. මහ නගර සභා මන්ත්‍රී - එම්.සුරංග එන් අපොන්සු මහතා
3. මහ නගර සභා මන්ත්‍රී - පී.ගාවින් මත්තෙස් මහතා
4. මහ නගර සභා මන්ත්‍රී - එෆ්.බී.නිලංක සිල්වා මහතා
5. මහ නගර සභා මන්ත්‍රී - එම්.සුදර්ශනි ප්‍රියන්තිකා කුරේ මහත්මිය
6. මහ නගර සභා මන්ත්‍රී - ඩබ්.රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

07(9) මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවට කමිටු සාමාජිකයින් පත් කිරීම

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මහ නගර සභා මන්ත්‍රීවරුනි,මුදල් කමිටුවට සභාපති ලෙස නගරාධිපති නිල බලයෙන් පත්වන අතර මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවට පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරුන් තේරී පත් වී ඇති බව දන්වා සිටිනවා.

1. මහ නගර සභා මන්ත්‍රී - එස්.බෙසර රවින්ද්‍ර ප්‍රනාන්දු මහතා
2. මහ නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදිප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා
3. මහ නගර සභා මන්ත්‍රී - යූ.ලලිත් ප්‍රනාන්දු මහතා
4. මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
5. මහ නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා

08. **<u>2021 වර්ෂය සඳහා මාසික සභා රැස්වීම් හා ස්ථාවර කමිටු රැස්වීම් සඳහා දින නියම කර ගැනිම. (2021.01.01 සිට 2021.12.31 දක්වා)</u>**

**09. <u>පුද්ගලික ස්වභාවයේ කරුණු</u> - නැත.**

**10. <u>ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තාව -</u>**

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

2020.12.11 මුදල් කමිටු වාර්තාවේ අංක 04 යටතේ 2020 ඔක්තෝම්බර් මාසයට අදාළ මූල්‍ය වාර්තාව ඇමුණුම - 01 ලෙස ඉදිරිපත් කර ඇත.

09. <u>වෙනත් කරුණු</u> - නැත.

සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් විය.

අ.කලේ/ ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු,
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2021.01.07 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදිය.